2017 නොවැම්බර්
01 කාණ්ඩය 02 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD®

සටන් කරන තාරුණ්‍යයට

## 19 වන ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල - රුසියාව



උල්පත වී නව ප්‍රවාහයක... 02



facebook එකට ආපු අලුත්... 08



මහා පිපුරුම් වාදය.... 13



පියනගමු අලුත් ලොවක් වෙත... 14



# උල්පත වී නව ප්‍රවාහයක අපි යමු නොනැවත



ඉපිද මැරෙන මිනිසුන් අතර සදාකාලික විරුවන් වන්නට හැකි වන්නේ ඉතාම සුවිශේෂී මිනිසුන්ටය. මේ ආවර්ජනය එවන් මිනිසුන් කැලක් ගැනය. මව්බිමේ හා දුක් විඳින මිනිසුන්ගේ නිදහස සියල්ලටම වඩා අගයමින් ජනතාව මුලාවට පත්කරන අවස්ථාවාදී දේශපාලනය වෙනුවට මිනිසුන්ට මිනිසුන් ලෙස සලකන අලුත් යහපත් ලොවක් නිමැවීම සඳහා ඔවුහු අරගල බිම තෝරා ගත්හ. මිනිස් වර්ගයාගේ යහපත වෙනුවෙන් තම ජීවිත පරිත්‍යාග කළහ. ඒ උතුම් මිනිසුන් අන්කිසිවෙකුත් නොව ඉල්මහා විරුවෝමය.

ඒ යුගයේ පැවති ආර්ථික අර්බුදයත් විරැකියාවත් තරුණ තරුණියන් සම්බන්ධයෙන් දැක්වූ ආකල්පමය පසුගාමීත්වයත් විසින් එවකට තරුණ පරපුර දැඩිව පීඩනයට ලක්කර තිබුණි. දේශපාලන, සමාජීය මෙන්ම සංස්කෘතික පරිහානිය එක ලෙස වර්ධනය වීම, ආගම්වාදය, ජාතිවාදය, මිත්‍යා මත පසුපස හඹායාම, මුදල් කේන්ද්‍ර කරගත් ආර්ථික ක්‍රමයකට තල්ලු වීම, ජාත්‍යන්තර මැදිහත්වීම් වැනි ඉතා බරපතල හේතු නිසාම පැවති පාලන ක්‍රමයේ වෙනසක් සෑම කෙනෙකුටම අවශ්‍ය විය.

ඒ වනවිටත් ධනවාදයට එරෙහි අරගල රැල්ලක් ලෝක දේශපාලනය තුළද මතුවෙමින් තිබුණි. සමාජවාදී සෝවියට් සංගමයේ පිබිදීමත්, කියුබන් විප්ලවයේ ජයග්‍රහණයත් හේතුවෙන් සමස්ත ලෝකය පුරාම අධිරාජ්‍යවාදයට එරෙහිව සමාජවාදයේ නැවුම් සුවඳක් හමා යන්නට විය. මේ සුවඳ, පීඩනයට ලක්වී සිටි අපේ රටේ තරුණ හදවත් පවා ප්‍රබෝධමත් කරලීය. ධනපති පාලකයන්ගේ කෲරත්වය, ඊනියා වමේ නායකයිගේ පාවාදීම් හා අපේක්ෂාභංගත්වයෙන් හෙම්බත්ව සිටි සෑම තරුණ හදවතකම පතුළේ වූ අපේක්ෂාව වූයේ සමාජවාදී විප්ලවවාදී දේශපාලන ක්‍රියාවලියක් තුළින් සමාජ ප්‍රශ්නවලට එරෙහිව නව පාලනයක් බිහිකර ගැනීමයි.

මේ තත්වය තුළ ''රෝහණ විජේවීර සලකුණ'' තරුණ හදවත් තුළ ප්‍රබල කම්පනයක් ඇති කරවීමට සමත් විය. ඔහුගේ දේශපාලන භාවිතාව විසින් රට තුළ දැඩි ආකර්ෂණීයත්වයක් නිර්මාණය කළේය. ඒ ප්‍රබෝධය විසින්ම සමාජවාදී විප්ලවයක් වෙනුවෙන්, සියලුදෙනා ජනතා විමුක්ති පෙරමුණ වටා රොදබැඳ ගන්නට විය. අලුත් ලොවක් ගොඩනැගීමේ අපේක්ෂාවන් පෙරදැරි කරගත් තරුණ පරපුරට මඟ කියන පහන් තරුව වූයේ ජනතා විමුක්ති පෙරමුණයි.

ලාංකීය පොළෝ තලය පුරා මුල් විහිදා ගිය දැවැන්ත වෘක්ෂයක් ලෙස පක්ෂය වැඩෙන්නට විය. එහි ප්‍රතිපත්ති, විනය, ආදර්ශය, ජීව ගුණය ආදී මේ හැමදෙයක්ම තරුණ පරපුරට අභිමානයක් ගෙනදුන්නේය. සමාජවාදී පාලනයක ආශ්වාදය සමාජීය උවමනාවක් බවට පත්වීමත් සමඟ දසදහස් ගණනින් ජනයා අරගලයට එකතු විය. මෙලෙස ඇති වූ ජනතා අරගලය, එවකට පැවති ආණ්ඩුව බිය වද්දන්නට තරම් ප්‍රබල විය. ධනපති පාලකයන්ගේ බත්බැලයන් වී සිටි පැරණි වමේ නායකයින්ට ද රෝහණ සහෝදරයාගේ දේශපාලන ක්‍රියාකාරීත්වය භයංකර සිහිනයක් විය.

ඒ භයංකාරත්වය විසින් මර්දනය ඇරඹුණි. භීෂණය පැතිර යමින් ලෙයින් යකඩින් දස දහස් ගණන් මිනිස් ජීවිත උදුරා ගැණුනි. අසූව දශකයේ අගදී ඒ අඳුරු යුගයේ ඉල් මහේ අඳුරුතම දිනකදී එවකට පැවති ආණ්ඩුව විසින් අප පක්ෂයේ නිර්මාතෘ ආදරණීය රෝහණ විජේවීර සහෝදරයා හා එවකට අප පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වූ උපතිස්ස ගමනායක සහෝදරයා ඇතුළු සහෝදර සහෝදරියන් හා හිතවතුන් බොහෝදෙනෙකුව මරා දමනු ලැබීය. ඔවුන්ගෙන් ගලාගිය රතු ලේ දහරාවන් මහා පොළොව තෙත බරිත කරවීය.

එහෙත් අදටත් එදා දිවිපිදූ ඒ සදාදරණීය විරුවන්ගේ ජීවගුණය, ඉරිතලා වියළී යන මේ ධනපති ක්‍රමයට එරෙහි, සමාජවාදී අරගලයේ නව අංකුර වෙත උකහා ගනිමින් තිබේ. ඔවුන්ගේ ආදර්ශයන් රැගෙන, ඔවුන්ගේ ජීවගුණය උකහාගෙන, ඔවුන්ගේ අරමුණ ජයග්‍රහණය කරවමින් ඔවුන් පැතූ ලොව ගොඩනැගීමට අදටත් දසදහස් ගණනින් තාරුණ්‍යයන් එකට එක්වෙමින් ඇත.

මේ අපේ පරම්පරාවේ වගකීමයි. කෲරත්වය වෙනුවට සහෝදරත්වයත් සූරාකෑම වෙනුවට සමානාත්මතාවයත් සැමට අධ්‍යාපනයත් මෙන්ම යහපත් සමාජ ක්‍රමයක් තුළ මිනිස් වර්ගයා ඉදිරියට ගෙනයාමේත් වගකීම දැන් අපේ උරමත තිබේ. එදාටත් වැඩියෙන් අද, ධනවාදය විසින් මිනිසා ම්ලේච්ඡත්වය කරා මහා වේගයකින් ආපස්සට ඇදගෙන යමින් තිබේ. දශක ගණන් ගෙවී යමින් තිබුණද සමාජීය ප්‍රශ්න තව තවත් උග්‍ර වෙමින් තිබෙද්දී ඒවාට පැලැස්තර මිස නිශ්චිතව පිළිතුරු දීමට නොහැකි බව ධනවාදය විසින් ඔප්පු කරමින් සිටී.

ඉදින් මේ අපේ වාරයයි. ඉල්මහේ විරුවන් පැතූ අලුත් ලෝකය ගොඩනැංවීම වෙනුවෙන්, සමාජවාදී සමාජයක් නිර්මාණය කිරීම වෙනුවෙන් වූ අරගලය ඉදිරියට ගෙන යන වගකීම දැන් අප සතුය. මේ ඊට හොඳම කාලයයි.

## ඔක්තෝබර් විප්ලවයේ සියවස සැමරේ



ඔක්තෝබර් විප්ලවයේ සියවස් සැමරුමට සමගාමීව ශ්‍රී ලංකාවේ විශාලතම සැමරුම් උත්සවය ජනතා විමුක්ති පෙරමුණ විසින් පසුගිය 27 හා 28 දෙදින පුරා පැවැත්වීය. එය විහාරමහාදේවී උද්‍යාන පරිශ්‍රයේ දී පැවැත්වූ අතර සමාරම්භක උත්සවය ජ.වි.පෙ. නායකයින් හා දෙස් විදෙස් ආරාධිතයින් රැසකගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. මෙහිදී සමරු ප්‍රදර්ශනයක්, වීදිනාට්‍ය දැක්මක්, පොත් එළිදැක්වීම්, සාහිත්‍ය සංවාද, විකල්ප සංගීත වැඩසටහන් හා චිත්‍ර නිර්මාණ වැඩසටහන්, ආදී වැඩසටහන් රැසක් පැවැත්වීය. එහිදී විදෙස් ආරාධිතයන් ලෙස විදේශීය තානාපතිවරු, රුසියානු කොමියුනිස්ට් පක්ෂ නියෝජිතයින් හා සෝවියට් ලේඛිකා ඉරීනා මලෙන්කෝ මැතිණිය ඇතුළු පිරිසක් සහභාගී වූ අතර විශ්වවිද්‍යාල ආචාර්යවරු, ප්‍රවීන සාහිත්‍යවේදීන් හා කලා කරුවන් ඇතුළු ආරාධිතයන් රැසක් ද සහභාගී වූහ.

## මෛත්‍රීපාල නැවත ජනාධිපතිවරණයට පැමිණියහොත් අනිවාර්යයෙන්ම පරාජයට පත්කරනවා



නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් විධායක ජනාධිපති ධූරය අහෝසි වියයුතු බවත් එසේ නොකර වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා නැවත ජනාධිපතිවරණයට පැමිණියහොත් අනිවාර්යයෙන්ම පරාජයට පත්කරන බවත් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා ප්‍රකාශ කරයි. පසුගියදා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවක දී ඔහු මේ බව අවධාරණය කළේය.

2015 ජනවාරි 08 ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණු මෛත්‍රීපාල සිරිසේන මහතා පොදු අපේක්ෂකයෙක් බවට පත්වූයේ විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමේ මූලික එකඟතාවය මතයි. විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අත්‍යවශ්‍යයයි. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා පාර්ලිමේන්තුවේ 2/3 බලයත් ඉන් අනතුරුව ජනමත විචාරණයකුත් අවශ්‍ය වේ. විධායක ජනාධිපති ධූරය අහෝසි කරන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වෙනුවෙන් තමයි 2015 ජනවරම ලැබුණේ. එම මැතිවරණ පොරොන්දුව ඉටුකිරීම ජනාධිපතිවරයාගේත් ආණ්ඩුවේත් වගකීම බව හා විධායක ජනාධිපති වෙනුවට විධායක අගමැතිවරයෙකු පත් කිරීමට ජ.වි.පෙ. ඉඩ නොදෙන බව ද ඔහු වැඩිදුරටත් අවධාරණය කළේය.

## චීන කොමියුනිස්ට් පක්ෂයේ සමුළුවට ජවිපෙන් සුභපැතුම්




චීන කොමියුනිස්ට් පක්ෂයේ 19 වන මහා සමුළුව පක්ෂයේ මහ ලේකම් හා වත්මන් චීන ජනාධිපති ෂී ජින්ග් පින්ගේ ප්‍රධානත්වයෙන් පසුගිය දා ආරම්භ කෙරුණි. මෙවර සමුළුවේ තේමාව වී ඇත්තේ "චීන අනන්‍යතාවය සහිත සමාජවාදය" යන්නය. එම සමුළුව සඳහා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් සුභපැතුම් එක් කර තිබේ.

## සයිටම් අහෝසි කිරීමේ අවසන් අරගලයට පෙළගැසෙයි



"සයිටම් අහෝසි කිරීමේ අවසන් අරගලයට පෙළගැසෙමු" යන්න තේමා කරගනිමින් මාලබේ සයිටම් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට එරෙහිව සයිටම් විරෝධී ජන පවුර මඟින් අත්පත්‍රිකා බෙදා දීමේ වැඩසටහනක් ඔක්තෝබර් 19 දින කොටුව දුම්රියපළ ඉදිරිපිටදී පැවැත්වීය. ආණ්ඩුව මේ සම්බන්ධයෙන් නිසි විසඳුමක් නොදුන්නොත් ඉදිරියේදී දැඩි ක්‍රියාමාර්ග ගන්නා බව ඔවුන් අවධාරණය කරයි. එහි දී අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා විසින් ද අදහස් දැක්වීය.

## සමාජවාදී ශිෂ්‍ය සංගමයෙන් රට පුරා විරෝධතා සතියක්




පාසල් වියදම් දෙමව්පියන් මත පැටවීම වහා නවතන ලෙසත් අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් 6%ක් වෙන් කරන ලෙසත් ආණ්ඩුවට බල කරමින් රට පුරා විරෝධතා සතියක් ආරම්භ කෙරුණි. ලංකාවේ ප්‍රධාන පාසල් අසල හා ප්‍රධාන නගරවල මෙම විරෝධතා සංවිධානය කර තිබූ අතර බැනර් අත්සන් කිරීම හා අත්පත්‍රිකා බෙදාහැරීමේ වැඩසටහන් ද පැවැත්වීය. සමාජවාදී ශිෂ්‍ය සංගමය මගින් සංවිධානය කළ මෙම විරෝධතා මාලාව සඳහා විශාල ජනතා අවධානයක් යොමු විය.

*ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික, ඌව පළාත් සභා මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න සහෝදරයා සමඟ කළ සංවාදයකි.*



# පාලකයින් කොහොමටත් ජනතාවාදී සටන්වලට විරුද්ධයි

**ඔබ ජ.වි.පෙ. දේශපාලනය තෝරා ගත්තේ ඇයි?**

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය තෝරා ගන්න හේතුව අපේ ප්‍රශ්න විසඳන්න, දුක්විඳින ජීවිත ගොඩනගන්න කිසිම උත්සාහයක් හෝ ක්‍රමවේදයක් මේ තිබෙන පාලනයට නැහැ කියන අවබෝධය තිබුණා. ඒත් එක්කම අපි කියවපු "අම්මා" "ගුරු ගීතය" වගේ පොත්පත් එක්ක විකල්පයක් ලෙස දැක්කෙ ජනතා විමුක්ති පෙරමුණ විතරයි.

**වාමාංශික දේශපාලනය තෝරාගනිද්දී හා තෝරාගෙන වැඩ කරද්දී ඔබ මුහුණ දුන් අභියෝග මොනවාද?**

මේ දේශපාලනය තෝරගනිද්දී අපේ ඥාති, හිතවතුන් ඒකට කැමති වුණේ නෑ. මොකද ඔවුන් පුරුදු වෙලා හිටියේ පවතින සමාජ ක්‍රමයට. ඔවුන් අපේ දේශපාලනයට විරුද්ධ වුණා. අකුල් හෙළුවා. නමුත් දැන් තත්වය වෙනස්. ඔවුන් සියලුදෙනා දැන් අවබෝධ කරගෙන තියෙනවා, අපි පවතින අසාධාරණයට විරුද්ධව පෙනීසිටින, සටන්කරන කණ්ඩායමක් ලෙස. අද වනවිට ඔවුනුත් අපේ ගමනේ කොටස්කරුවන් බවට පත් වෙලා.

**දේශපාලනය කිරීම සඳහා එම අභියෝග ජය ගැනීමට ඔබ කටයුතු කළේ කොහොමද?**

පවතින අසාධාරණය දැකපු කෙනෙක්, විඳපු කෙනෙක් විදියට, මම දුප්පත් පවුලක ඉපිද, ඉගෙනගෙන ගුරුවරයෙක් විදියට සේවය කරමින් සිටින අතරතුරදී තමයි ජ.වි.පෙ. පූර්ණකාලීන දේශපාලනයට අවතීර්ණ වුණේ. "වානේ පන්නරය ලැබූ හැටි" "අම්මා", "සැබෑ මිනිසෙකුගේ කතාවක්", "ගුරු ගීතය" වගේ කෘතීන් හා අපට ඇසුරු කරන්න ලැබුණු ගුරුවරුන් හේතුවෙන් මේ දේශපාලනයට පිවිසෙන්න හොඳ පන්නරයක් ලැබුණා. ඇත්තටම කිව්වොත් අභියෝගයක් වෙලා නවත්තන්න පුළුවන්කමක් තිබුණෙ නැහැ. ගඟක් ගලාගෙන යනවා වගේ වේගයෙන් පහළට ගලාගෙන ආවා. වාමාංශික දේශපාලනයෙන් ඉස්සරහට එන්න පුළුවන්කමක් ලැබුණා. ආපහු හැරිච්ච තැනක්, පසුබැහැපු තැනක් මේ දේශපාලන ජීවිතේ නැහැ.

**ඔබ මේ දිනවල ජනතා සටන් රැසකට නායකත්වය දෙමින් සිටිනවා. ඒ ගැනත් කියමු.**

ඌව, වෙල්ලස්ස, බිම්තැන්න යන ප්‍රදේශ තුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08කට අයත් භූමියෙන් අක්කර 62500ක් සිංගප්පූරුවේ "ගැසල් වෙන්චර්ස්" නම් බහුජාතික සමාගමට දෙන්න යනවා උක්වගාව සඳහා. ඡන්දෙ දීපු ජනතාවට ගෙයක් හදාගන්න ඉඩම් කැබැල්ලක් නොදෙන ආණ්ඩුව, ඉඩම් ඔප්පුවක් බලපත්‍රයක් නොදෙන ආණ්ඩුව විදේශීය සමාගමකට අක්කර දහස් ගණනින් ඉඩම් දෙන්න ලෑස්තියි. ඉඩම් කොල්ලයට විරුද්ධව ඒ සටනට අපි නායකත්වය දෙමින් සිටිනවා.

ඒ වගේම මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුමේ ජල උල්පත් පිළිබඳ පරිසර අධ්‍යයන වාර්තා කිසිවක් සකස් නොකර මහින්ද රාජපක්ෂ ආණ්ඩුව විසින් ආරම්භ කළ උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් මේ වනවිටත් මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුමේ ඉතා විශාල ජනකායක් අපහසුතාවයට ලක්වෙලා. ඒ නිසා "උමා ඔය බහු විනාශකාරී ව්‍යාපෘතියට එරෙහි ජනතා ව්‍යාපාරය" ලෙස එම සටනට නායකත්වය දෙමින් සිටිනවා. අනෙක් අතට ඌව පළාතේ රැකියා විරහිත උපාධිධාරීන් 4000ක් පමණ සිටිනවා. ඉතාම දුෂ්කරතා රැසක් මැද්දේ ඉගෙනගත්ත තරුණ පිරිසක් රැකියා ලබා ගැනීමේ සටනක නිරත වෙනවා. ඒ නිසා රැකියා විරහිත උපාධිධාරී සංගමයට නායකත්වය ලබා දෙමින් සිටිනවා.

ඒ හැරුණුකොට මහා වාරිමාර්ග ව්‍යාපෘතියක් වන අඹේවෙල වාරිමාර්ග ව්‍යාපෘතියේ මහඇළට හයිලන්ඩ් කර්මාන්ත ශාලාවේ සියලුම අපද්‍රව්‍ය බැහැර කරනවා. ඒ නිසා අඹේවෙල ව්‍යාපෘතියේ ගොවි ජනතාවගේ වගා කටයුතු කරගෙන යන්න බැරි තත්වයකට පත්වෙලා තියෙනවා. ඒ ඔස්සේ නිර්මාණය වී තිබෙන විශාල ආර්ථික, සෞඛ්‍ය හා පාරිසරික ගැටලු රැසක් සඳහා විසඳුම් සොයන සටනකත් නිරතව සිටිනවා. ඒ වගේම ඌවේ විතරක් නෙවෙයි. මුළු රටේම විශාල පාරිසරික ප්‍රශ්න රාශියක් නිර්මාණය වී තිබෙනවා. ඒ නිසාම මුළු රටේම පරිසරය සුරැකීම වෙනුවෙන් ඇතිකළ පාරිසරික සංවිධානයක් වන "ජීවයේ අයිතිය" සංවිධානයේ කැඳවුම්කරු ලෙසත් කටයුතු කරනවා.

**උමා ඔය සටන ඉතිහාසයේ සුවිශේෂී තැනක් හිමිවන සටනක්. එම සටනේ ගමන් මඟ කොයි වගේද?**

මේ සටන පැති කීපයක් ඔස්සේ විහිදෙනවා. මේක පරිසරය සුරක්ෂිත කිරීමේ සටනක්. ගහකොළ, සතාසීපාවා සුරකින, කඳු නිම්න සුරකින සටනක්. ජලය සම්බන්ධ ප්‍රධාන ප්‍රශ්නයක්. ඒ නිසා මෙය ජල සටනක් බවටත් පත්ව තිබෙනවා. උමා ඔය ව්‍යාපෘතියට මුල්ගල තැබුවේ 2008 අප්‍රේල් 29 දින හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ. මෙම ව්‍යාපෘතිය භාරව හිටියේ චමල් රාජපක්ෂ ඇමතිවරයා. එවකට මම පාර්ලිමේන්තුවේදී කිව්වා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන්න එපා, මේකෙන් විශාල ප්‍රශ්න රැසක් ඇති වෙනවා කියලා. කොහොම කිව්වත් මේක නවත්වන්න බැරි වුණා. ඊට පස්සෙයි "උමාඔය සුරැකීමේ ජනතා ව්‍යාපාරය" බිහිවන්නේ. එහි කැඳවුම්කරු මම. ලේකම් වුනේ පරිසරවේදී අතුල ප්‍රියන්ත, සභාපති කැලුම් ප්‍රියන්ත.

මෙම ව්‍යාපාරයට ජනතාව මුලදී අපිත් එක්ක එකතු වුනේ නැහැ. මිනිස්සු අපිට චෝදනා කළා, සංවර්ධනයට අපි විරුද්ධයි කියලා. එසේ චෝදනාවට ලක්වෙමින් වුවත් අපේ සටන දිගටම ගෙන ගියා. මේ විනාශය ජනතාව පිළිගන්නෙ නැති නිසාත් ඒ විනාශය අපිට දරාගත නොහැකි නිසාත් අපි ශ්‍රේෂ්ඨාධිකරණයට යාමට තීරණය කළා. නඩුවක් පැවරුවා. ඒ වගේම මේ කරුණ ගැන මාධ්‍යවලට කිව්වා.

ඒ අතර 2014 දෙසැම්බර් 26 මකුල්ඇල්ල කියන ගමට යටින් මේ ව්‍යාපෘතියේ ලොකු ජලකාන්දුවක් සිද්ධ වුණා. ඒ වෙලාවේ ජනතාවට අපි කිව්වා ඉස්සර කියපු විනාශයේ ප්‍රතිඵලය තමයි ඔය, දැන්වත් තීරණයක් ගන්න කියලා. "උමා ඔය බහුවිනාශකාරී ව්‍යාපෘතියට එරෙහි ජනතා පෙරමුණ" කියලා දෙවන සංවිධානය ඇති කළා. ඒ පෙරමුණයි දැන් ක්‍රියාත්මක වන්නේ. ඒ ඔස්සේ විශාල සටන් ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙනවා. මේ වෙද්දි විශාල ජන කණ්ඩායමක් අපිත් එක්ක එකතු වෙලා ඉන්නවා. පසුගියදා පැවැත්වූ හර්තාලයට 40,000කට අධික ජනතාවක් එකතු වුණා. නමුත් ජනතාව අපි වටා එකතු වන විට සෑහෙන විනාශයක් සිදුවෙලා හමාරයි. ඒක තමයි අපේ රටේ අවාසනාව. මේ ප්‍රශ්නෙදි විතරක් නෙවෙයි. අනෙක් ප්‍රශ්නවලත් තත්වය මේකයි.

**සටන් මෙහෙයවද්දී පාලකයන්ගේ හා ජනතාවගේ හැසිරීම් ගැන ඔබට තිබෙන අත්දැකීම මොකක්ද?**

පාලකයො කල්පනා කරන්නෙ ජනතාව ගැන හෝ පරිසරය ගැන හෝ නෙමෙයි. ඔවුන් කල්පනා කරන්නේ තමන්ට ලැබෙන ලාභය ගැනයි, තනතුර රැකගන්නෙ කෙසේ ද යන්න ගැනයි. පාලකයින් කොහොමටත් ජනතාවාදී සටන්වලට විරුද්ධයි. බොහෝවිට ජනතාවත් පාලකයන් පිළිබඳ අන්ධ විශ්වාසයකයි සිටින්නේ. අනෙකාගේ ප්‍රශ්නය තමාගේ ප්‍රශ්නයක් බවට පත් කරගන්නේ නැහැ. එහෙම ජනතාවක් සිටින තැනක ජනතා සටනක් කරන්න පිරිසක් එකතු කරගන්න හරිම අමාරුයි. නමුත් අපි ඒ සටන කළ යුතුයි. ජනතාවට සත්‍ය පහදා දිය හැකිනම් සටන්වලට ජනතාව එකතු කරගැනීම අපහසු නැහැ. දැන් ජනතා විමුක්ති පෙරමුණ වටේ එකතු වූ ජනතාවක් සිටිනවා. එය කාලාන්තරයක් තිස්සේ සිදුකළ සටන්වල සහ ගොඩනැගූ විශ්වාසය මත පවතින්නක්.

පාලකයො කල්පනා කරන්නෙ ජනතාව ගැන හෝ පරිසරය ගැන හෝ නෙමෙයි. ඔවුන් කල්පනා කරන්නේ තමන්ට ලැබෙන ලාභය ගැනයි, තනතුර රැකගන්නෙ කෙසේ ද යන්න ගැනයි. පාලකයින් කොහොමටත් ජනතාවාදී සටන්වලට විරුද්ධයි. බොහෝවිට ජනතාවත් පාලකයන් පිළිබඳ අන්ධ විශ්වාසයකයි සිටින්නේ.

**සටනක් මෙහෙයවද්දී තරුණයන්ගේ ක්‍රියාකාරීත්වය සුවිශේෂීයි. ලාංකීය තාරුණ්‍ය ගැන ඔබේ කියවීම මොකක්ද?**

පොදුවේ හිතුවහම තරුණයින් කියන්නේ ජවය වැඩි, අත්දැකීම් අඩු පිරිසක්. ඒ වගේම පොදු සමාජය ගැන හිතන්න උගන්වන අධ්‍යාපනයක් මඟින්, සංස්කෘතියක් මඟින්, සාහිත්‍යයක් මඟින් ඔවුන්ව සමාජයේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරන සැබෑ මිනිසුන් ලෙස ගොඩනැඟිය හැකි බව අප අත්දැකීමෙන් දන්නවා. අපේ රට ගැන, රටේ අනාගතය වෙනුවෙන් තරුණයින්ගේ මැදිහත්වීම ගැන අපට සුබවාදී බලාපොරොත්තුවක් තිබෙනවා. එහෙත් ඒ සඳහා අප තවත් වෙහෙස විය යුතුයි. දැනටමත් සමාජවාදී තරුණ සංගමය මේ කාර්යයභාරයට උර දීලා තිබෙනවා. රටේ තරුණ ප්‍රශ්නවලදී වගේම සමාජයේ පොදු ගැටලුවලට එරෙහිවත් ඔවුන් සටන් මෙහෙයවමින් ඉන්නවා. ඒ තුළ තිබෙන තරුණ නියෝජනය පිළිබඳ විශාල සතුටක් දැනෙනවා.

# විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයේ සම නිර්මාතෘ FRIEDRICH ENGELS



විද්‍යාත්මක කොමියුනිස්ට්වාදය ගොඩනැඟුණු ඉතිහාසය වූ කලී ලෝකය උඩු යටිකුරු කරන ලද ඉතිහාසයයි. පංති සමාජය බිහිවූ දා පටන් වසර දහස් ගණනක් පුරා සමාජයේ ආර්ථික බලය හිමි පංතිය බලවතුන් හෝ ප්‍රබල යැයිද, ප්‍රබලයාට හැමවිටම දුබලයා යටපත් වීම ස්වාභාවික යැයිද වූ සම්මත මතයක් විය. ඊට එදිරිව, අලුත් ප්‍රබලයෙක් ගැන, එසේත් නැතිනම් නියම ප්‍රබලයා වැඩ කරන ජනතාව යැයිද ලෝකය හමුවේ හෙළි කළ ඉතා විශ්වාසනීයතම න්‍යාය ධර්මය වූ විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයේ සම නිර්මාතෘවරයා වන්නේත් කාල් මාක්ස් ගේ වෘත්තීය විප්ලවවාදී සගයා වන්නේත් ෆෙඩ්‍රික් එංගල්ස් නම් මහා ප්‍රාඥයායි.

ලෝකය අධ්‍යයනය කිරීමෙන් නොනැවත එය විප්ලවවාදී ලෙස වෙනස් කිරීම සඳහා නිර්ධන පංතියට අත්‍යාවශ්‍ය අවියක් ලෙස, විද්‍යාත්මක කොමියුනිස්ට්වාදය ගොඩනැගීමෙහිලා කාල් මාක්ස් හා උරෙන් උර ගැටී, විටෙක සහෝදරයෙක් ලෙසද, විටෙක ගුරුවරයෙක් ලෙසද, ඉතා නිහතමානී සහ පරිත්‍යාගශීලී ලෙස මුළුමහත් විප්ලවීය ඉතිහාසයටම මහා ආදර්ශයක් වූ ෆෙඩ්‍රික් එංගල්ස් ඉපදුණේ 1820 නොවැම්බර් මස 28 දින ජර්මනියේදීය. තම පියාගෙන් උරුම වූ ව්‍යාපාරයන් හි නියැලෙන අතර 25 වියැති තරුණයෙකු ලෙස තමා යටතේ සේවය කරන කම්කරුවන්ගේ තත්වය කෙබඳුද යන්න හා එහි සෝචනීයභාවයත්, ඔවුන් සූරාකෑමට ලක්වෙන අන්දමත් අත්දුටු එංගල්ස් "වැඩ කරන කම්කරුවාගේ තත්වය" නැමැති කෘතිය ලියන ලදී. එසේම ධනවාදය හමුවේ බිහිවෙමින් පවතින අතිවිශාල නිර්ධන පංතිය, ලෝකයේ නිමැවුම්කරුවා ලෙස හඳුනාගන්නා එංගල්ස්, මාක්ස්ගේ ලිපි හරහා ඔහුව හඳුනා ගන්නා ලදී. දෙතැනක සිට එකම අරමුණකට යොමු වූ න්‍යාය ධර්මයක් ගොඩනගමින්, කාල් මාක්ස් සමඟ එංගල්ස් 1848 දී කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය එළිදක්වන අතර, ලෝකය පුරා සිටින වැඩ කරන ජනතාවට දැක්මක් සහ සහෝදරාත්මක ආයාචනයක් සමඟ, තමාගේ දෑතින් ලෝකය ගොඩනගන්නට ආරාධනා කරන ලදී.

සමාජවාදය මනෝරාජ්‍යයෙන් විද්‍යාව දක්වා ගොඩනැගීමට එංගල්ස්ගේ බුද්ධි මහිමයද මහෝපකාරී වූ අතර, මාක්ස්ගේ ප්‍රාග්ධනයේ 2 සහ 3 වෙළුම් සඳහාද සංස්කරණයෙන් දායක විය. විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයෙන් යෝජනා කරන සමාජවාදී සහ කොමියුනිස්ට් රාජ්‍ය දක්වා වූ න්‍යාය ධර්මය ලෙස ඓතිහාසික භෞතිකවාදය ගොඩනැගූ අතර පවුල, පෞද්ගලික දේපළ සිට රාජ්‍ය දක්වා පරිණාමය වූ මිනිස් සමාජයේ ඓතිහාසික ආකාරය හෙළිකරන ලදී.

වසර දහස් ගණනක් තිස්සේ මිනිසා බැඳ තිබූ ආගමික වියගහෙන් ගැලවීමේ මාර්ගය අධ්‍යයනය කළ ඔහු මාක්ස් සමඟ එක්ව ප්‍රකෘතියේ විකෘති කරන ලද මිත්‍යාව වෙනුවට මිනිස් ජීවිතය ගොඩනගන විද්‍යාත්මක ක්‍රමවේදයත්, එහි කර්තව්‍යයේ ස්වභාවයත් හෙළිදරව් කරන ලදී. එසේම එහි ද්වීඝඨනාත්මක (දයලෙක්තික) ස්වභාවය කුමක්ද යන්නත් දීර්ඝ අධ්‍යයනයක ප්‍රතිඵලයක් ලෙස ලොවට හෙළිකරන ලදී.

විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයේ මූලික න්‍යාය ග්‍රන්ථ වැඩි ප්‍රමාණයක නිර්මාතෘ වන්නේ ෆෙඩ්‍රික් එංගල්ස්ය. ඔහු වැඩ කරන ජනතාවගේ ජාත්‍යන්තර සංවිධාන ගොඩනැගීමෙහිලා අප්‍රතිහත ධෛර්යයකින් කැපකිරීම් කරන ලද අතර, එහි ප්‍රායෝගික සටන්කරුවෙක් ලෙස ද මහා ආදර්ශයක් ලොවට ඉතිරි කර ඇත්තේය.

ෆෙඩ්‍රික් එංගල්ස්ට කලින් මාක්ස් මිය යන අතර, ඒ වන විට ඔවුන් දෙදෙනා එක්ව නිර්මාණය කළ විද්‍යාත්මක කොමියුනිස්ට්වාදය, " මාක්ස්වාදය" ලෙස නම් කරන ලෙස ඔහු දෙවැනි ජාත්‍යන්තරයට යෝජනා කරන ලදී. එසේ හෙයින් ඔහුට පසු ලෝකයේ වැඩ කරන ජනතාව විසින් ගොඩනගන සමාජවාදී සමාජයේ මහා ආදර්ශය ලෙස එංගල්ස් නාමය තවමත් ඉදිරියෙන් සිටින අතර, 1895 අගෝස්තු 05 දින ඔහු මිය යන විට, 20 වෙනි සියවස සමාජවාදයේ ප්‍රායෝගික පරීක්ෂණයකට සූදානමින් සිටින ලදී.

## පියනගමු අලුත් ලොවක්...


*14 පිටුවෙන්*

තාක්ෂණය, වර්ධනය සඳහා එය බොහෝ උපකාරී විය. අද වන විට රුසියාව ප්‍රමුඛ සෝවියට් දේශයෙන් බිඳීගිය රටවල් මංකොල්ලකෑම්, අපරාධ, ජාතිවාදී ගැටුම්, යාචකයින්, ගණිකාවන්ගෙන් පිරුණු අරාජික රටවල් බවට පත් වී ඇත. ක්‍රීඩා ක්ෂේත්‍රයේ තිබූ ජයග්‍රහණ ගිලිහී යමින් තිබේ. එහෙත් සමාජවාදී කියුබාව ක්‍රීඩා, සෞඛ්‍ය, කලාව, තාක්ෂණය, විද්‍යාව ආදී ක්ෂේත්‍රයන්ගෙන් ඉදිරියට යමින් තිබෙන අතර, අපරාධ සිදුවීම් වාර්තා වීමක් දක්නට නොලැබේ. අනෙකුත් සමාජවාදී රටවල තත්වය ද ධනවාදයට වඩා බෙහෙවින් යහපත්ය.

**සමාජවාදයේ ජයග්‍රහණ**

- සමාජවාදය නිසා විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව ඉතා කෙටි කාලයකින් සීඝ්‍ර වර්ධනයක් විය. ඒ අනුව මුල්ම අභ්‍යවකාශගත වීම සෝවියට් දේශය විසින් අත්පත් කරගන්නා ලදී.
- 1917 වන විට අන්ත පසුගාමී නොදියුණු වැඩවසම් රටක් ලෙස තිබූ රුසියාව සමාජවාදය යටතේ 1940 දශකය අවසන් වීමට පෙර ලොව මුල්ම විරැකියාවෙන් තොර රට බවට පත් විය.
- 1917 වන විට ජාතිකත්වයන් 150කට වඩා ජීවත් වූ, ජාතිවාදී ගැටුම් පැවති රුසියාව සමාජවාදය තුළින් එකම ජාතියක් බවට පත් කිරීමට හැකි විය.
- 1917ට පෙර ලිඛිත භාෂාවන්, හෝඩීන් නොතිබූ ජාතීන් විශාල සංඛ්‍යාවක් සිටි රුසියාව සමාජවාදය යටතේ ඔවුන්ට ලිඛිත භාෂා හා හෝඩි හඳුන්වා දී සාක්ෂරතාවයද ඉහළ නංවන ලදී.
- දැනට ලොව එක් වෛද්‍යවරයෙකුට සිටින අඩුම රෝගීන් සංඛ්‍යාව ඇති රට ලෙස සමාජවාදී කියුබාව හඳුන්වයි.
- ඩෙංගු රෝගය තුරන් කළ රටක් ලෙසටද කියුබාව හැදින්වේ.
- දැනට ලොව ඉහළම සාක්ෂරතා ඇති රටවල් ලෙස ද සමාජවාදී රටවල් හඳුන්වයි.
- පසුගිය වසරවල ලෝකයේ රටවල ආර්ථික වර්ධන වේගය අඩු වෙමින් පැවති නමුත් සමාජවාදී චීනයේ සහ වියට්නාමයේ ආර්ථික වර්ධනයේ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.
- ලොව අපරාධවල අඩුවීමක් පෙන්නුම් කරනුයේ සමාජවාදී රටවලය. සමහර සමාජවාදී රටවල අපරාධ සිදුනොවන තරම්ය.

## bookiයෙන්










මිනිසුන් ශ්‍රේෂ්ඨ වන්නේ
බාහිර පෙනුමෙන් නොවේ....

FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112193721
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syulanka.com

# එන්න ජීවිතය තිබෙන ඉසව්ව දකින්න...

බොහෝ හැලහැප්පීම් මැද ජීවත් වන මිනිසුන් වන අපි සැම තම ජීවිත කාලය ධනවාදය තුළ ගෙවා දැමුවන් වන්නෙමු. ධනපති මතවාදය විසින් අප බොහෝ දෙනෙකුගේ චින්තනය හසුරුවන නිසාවෙන්ම කුණු වී දුගඳ හමන බව දැන දැනම වුව අනෙකා විසින් මවාපාන සුන්දර ලෝකයක් පිළිබඳ සිහින මවමින් සිටිමු. අප කාටත් ජීවත් වීම උදෙසා සිහියක් තිබිය යුතුය. එය එසේ වන්නේ යථාර්ථවාදී වූ විටය.

නමුදු අපි අපට ළඟාවිය නොහැකි හීන පසුපස දුවමින් ඇත්තෙමු. නැතහොත් දුවගොස් හතිවැටී ඇත්තෙමු. ඒ ධනවාදී සමාජය විසින් නිර්මාණය කර දුන් හීන පසුපසය. අප ඉදිරියේ මවා පා ඇති එම සිහින සැබෑ කරගත හැක්කේ වේ නම් ඒ ඉතා අතළොස්සක් වන ධන බලය හිමිවූවන්ට පමණමය. එනිසා අප අතර වෙසෙන බොහෝ දෙනෙකු තමා කවුරුන්ද යන්න හඳුනාගෙන නොමැත. එහෙයින්ම ඉහත ක්‍රමය විසින් ගොඩනගා ඇති මතවාදයන්ට දැනුවත්ව හෝ නොදැනුවත්ව ගොදුරු වී ඇත්තෙමු. නවීන විද්‍යාව හා තාක්ෂණය විසින් නිපදවා ඇති බොහෝ දේ අද අපට අහිමිය. ඒවා ප්‍රාග්ධන හිමිකරුවන්ගේය. ඒවා පරිහරණයට ඔවුන් නියම කරන මිල ගෙවිය යුතුය. එසේ මුදල් සෙවීමට දිවා රෑ දෙකෙහිම වැඩ කළද නොහැකිය. එනිසාවෙන්ම වංචාව, දූෂණය අක්‍රමිකතාවලින් තොරව සිදුවන කිසිවක් නොමැති තරමය. අප අත්විඳින යථාර්ථය එයමය.

ඒ නිසා ධනවාදය ජීවිතය යැයි පෙන්වන හැමතැනකම පිරී ඇත්තේ මරණයයි. අප ජීවත් වන අන්ධකාර කොදෙව්ව ද ධනවාදයේ විදුලි එළිවලින් ආලෝකමත් වෙද්දී පවා සැඟවිය නොහැකි ලෙස බලන බලන අත ඇත්තේ මරණයයි. නව ලිබරල්වාදයේ දෙවන ඉනිම වෙනුවෙන් නානාප්‍රකාර සැරසිලිවලින් විචිත්‍ර වෙද්දී ධනවාදී සමාජය සියදිවි නසාගන්නන්ගේ පාරාදීසයක් වී ඇත. අපේක්ෂා භංගත්වයෙන් හා අතිශය අතෘප්තියෙන් පිරුණු මේ කොදෙව්වේ ජීවිතය අතහැර පලා යෑමට බොහෝදෙනා පෙළඹේ. එක්කෝ ඔවුන් සියදිවි නසා ගනී නැත්නම් කරදිය වළල්ලෙන් එපිටට පියාඹා යාමට වෙර දරයි. එහෙත් කරදිය වළල්ලෙන් එපිට ඇත්තේද කුණු වී ගඳගසන මේ ධනවාදයමය. (අද ඒ බව කරදිය වළල්ලෙන් එහාට ගිය වුන්ගේ ජීවිතවලින් දැකගත හැකිය) ඒ තුළ ද ඇත්තේ ජීවිතය නොව මරණයම පමණි. එසේ නම් සතුට සැනසුම කොහේවත් නැති ද? ජීවිතය අරුත් සුන්ද? නැත. ජීවිතය ඇත්තේ ධනවාදය පෙන්වන ඉසව්වේ නොවේමය. එය ඇත්තේ, අන් තැනකය...

තරුණ ඔබට ජීවිතයක් හා හෙටක් අවැසිය. විචිත්‍ර වෙයිවර්ණ සැරසිලිවලින් දවටා ඇති දවටනය ඔබට විනිවිද දැකිය හැකිනම්, පවතින සමාජ ආර්ථික ක්‍රමයේ සැබෑ නිරුවත දැක ගත හැකිය. පවතින සමාජ අසාධාරණය හෙළිදරව් කළ හැකිය. ඒ වගේම ඊට එරෙහි සැවොම එක්ව සටන් කළ යුතුය.

එන්න, අපත් සමඟ ඒ දෙසට පියනගන්න. සහෝදරත්වයෙන් බැඳුණු ඒ සොඳුරු අඩවියට, ජීවිතය තිබෙන ඉසව්ව දකින්න...

## ඔක්තෝබර් 02

කැකිරාව මඩාටුගම ප්‍රදේශයේ පාසලක සිසුවියක් හදිසියේ පාසලින් නෙරපීමේ සිදුවීමක් fb පිටු අතර දක්නට ලැබුණා. ඒ එම පාසලේ විදුහල්පතිවරිය විසින් එම සිසුවිය ගැබිණියක් වී ඇති බවට තීරණය කිරීම හේතුවෙනි. ඒ සඳහා වන විදුහල්පතිණියගේ නිරීක්ෂණ ඉතා විහිලුසහගතය. එනම් සිසුවිය උදෑසන කාලයේ වමනය කිරීමයි. නමුදු ඒ ඇසූ සැනින් අපට පසක් වන්නේ සිසුවියක උදෑසන වමනය කරන්නේ ගැබිණියක වූ විටෙක පමණද යන්නයි. සිසුවිය මුහුණ දී ඇති තත්වයත් එහි සබෑ පසුබිමත් ගුරුවරුන් යැයි කියාගන්නා පිරිස විසින් හෝ විදුහල්පතිණිය විසින් හෝ හඳුනාගැනීමට අසමත් වීම කණගාටුදායකය. අනෙක් පුදුම සහගත බව නම් සිසුවියක හාමතේ වමනය කිරීමට තරම් වන ඇගේ පසුබිම නොසොයා ඇය සම්බන්ධ එවන් තීරණයක් ගැනීමට තරම් වන පිරිසක් ගුරුවරුන් වූයේ කෙලෙසද යන්නයි.

## ඔක්තෝබර් 23



එ.ජා.ප. පළාත් සභා මන්ත්‍රීවරයෙකු පාතාලයේ පිරිසක් සමඟ අත්අඩංගුවට ගැනීම පිළිබඳ පුවතක් fb පිටු තුළ දක්නට ලැබුණු අතර එහිදී අපරාධ රැසකට සම්බන්ධ යැයි සැක කෙරෙන ගිනිඅවිද ඔහුගේ නිවසින් හමුවී තිබුණි. ඒ අතරම පසුගිය සමයේ සිදුවූ නමගිය අපරාධ රැසකට සම්බන්ධ පාතාල කල්ලි සමඟ ඔහුගේ සෘජු සම්බන්ධයක් ඇති බවට ද තොරතුරු ලැබී ඇති බව පැවසේ. අප රටේ සිදුකෙරෙන මහාපරිමාණ අපරාධ බහුතරයකට බලයේ සිටින හෝ බලයේ සිටි දේශපාලඥයින්ගේ සම්බන්ධයක් ඇති බව නොරහසකි. අප රටේ දේශපාලනය තුළට අපරාධකාරයින් හා වංචනිකයින් ගෙනැවිත් ඇත්තේ පවතින දේශපාලන ක්‍රමය විසින්මය. ඔවුන් පළාත් පාලන ආයතනයේ සිට රටේ ඉහළම විධායකය දක්වා වන සෑම මහජන නියෝජිත ආයතනයක්ම නියෝජනය කරන තැනට ගෙනවිත් තිබේ. මෙය වෙනස් කිරීම සඳහා තවදුරටත් අප රටේ පවතින ක්‍රමය අසමත් අතර ඉදිරියටද පවතින්නේ මෙකී ක්‍රමය නම් විය හැක්කේ මීටත් වඩා හොරුන්, වංචනිකයන් සහ අපරාධකරුවන් මහජන නියෝජිත ආයතන තුළ බලය තහවුරු කර ගැනීමය. මෙය වෙනස් කළ හැක්කේ රට තුළ සිදුවන දේශපාලන ක්‍රමයේ වෙනසකින්ම පමණි.

## ඔක්තෝබර් 25

නව ව්‍යවස්ථාවක් සම්බන්ධ විශාල කතාබහක් fb පිටු අතර නිතර දක්නට ලැබෙන අතර ඒ සම්බන්ධ කිසියම් නිශ්චිතකමකින් යුතුව කරුණු ඉදිරිපත් කිරීමකට වඩා බොහෝ සෙයින් ඒ පිළිබඳ අනවබෝධයෙන් කළ කරුණු දැක්වීම් රැසක්ම දැකගත හැකිවිය. විශේෂයෙන්ම යම් රටක පුරවැසියන්ට එරට ව්‍යවස්ථාව වැදගත් වන්නේ තමන් යටත් වන්නේ කුමන නීතිරීතිවලටද යන්නත් තමන්ට කොපමණ ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් ප්‍රමාණයක් හිමිව තිබේද යන්නත් දැනගැනීමටය. ව්‍යවස්ථාවක් සම්පාදනයේදී එයට පුරවැසියන්ට දායක වීමට අවස්ථාවක් ලැබේ නම් එයද ඉතාමත් වැදගත්ය. ලාංකීය ඉතිහාසයේ ප්‍රථම වතාවට අවම මට්ටමකින් හෝ එවන් අවස්ථාවක් පුරවැසියන්ට හිමිවන්නට තිබෙන්නේ මෙම නව අවස්ථාවේදීය. එම අවස්ථාව ප්‍රජාතන්ත්‍රවාදය අතින් ගත් කල වඩා යහපත්ය. එසේම නව ව්‍යවස්ථාවක් සම්මත කරගත හැකි නම් එය දැනට පවතින 19 වතාවක් සංශෝධනයට ලක් වූ මේ බහුබූත ව්‍යවස්ථාවට වඩා වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වනු ඇත.



බොරු දේශප්‍රේමී සළු පොරවා ගත් පරාජිත දේශපාලන කණ්ඩායම් තම පැවැත්ම සඳහා කිසිවෙකුත් නොදන්නා ව්‍යවස්ථාවක් පෙන්වමින් මහා දේශප්‍රේමීන් වීමට කැසකවයි. එසේම මෙයට විරුද්ධව අද වන විට දකුණේ ද උතුරේද මෙන්ම රටපුරාමද සිදුකරනු ලබන ජාතිවාදී ඝෝෂාවන් හේතුවෙන් රටේ ජනතාවට ලැබීමට යන ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩ ප්‍රමාණයක් ඇහිරී යෑමේ අවධානමක් පවතී. එහෙයින් රටට සැබෑවටම ආදරය කරන අය වෙත්නම් කළ යුතුව ඇත්තේ මේ පිළිබඳව කෙරෙන සංවාදයට ඉඩ විවර කරගැනීම හා ඒ තුළින් ප්‍රජාතන්ත්‍රවාදී, ජනතාවාදී නව ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම උදෙසා දායකත්වය ලබාදීමයි.

## ඔක්තෝබර් 27-28

ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයට සියවසක් සපිරීම නිමිත්තෙන් විහාරමහාදේවී පරිශ්‍රය තුළ ජ.වි.පෙ. විසින් සංවිධානය කර තිබුණු



ඔක්තෝම්බර් විප්ලවයේ සියවස් සමරුව පිළිබඳ බොහෝ සටහන් fb පිටු අතර දක්නට විය. සමාජ වෙනසක් වෙනුවෙන් සිතන බොහෝ දෙනාගේ සිහිනයක් වන සමාජවාදය ගොඩනැගීම සැබෑ ලෝකය තුළ ප්‍රායෝගිකත්වයට නැගූ ඔක්තෝම්බර් විප්ලවය ලෝකවාසී වැඩකරන ජනයාට ඉතා සුවිශේෂීය. එහෙයින්ම ලාංකීය භූමිය තුළද එවන් වූ නව සමාජයක් බිහිකිරීමෙහි ලා වෙහෙසෙන ජනතා විමුක්ති පෙරමුණ විසින් ශ්‍රේෂ්ඨ ඔක්තෝබරයේ ජයග්‍රහණයන් තුළින් බොහෝ අත්දැකීම් ලබාගනු ඇති බව එහි රැස්ව සිටි කාගේත් අදහස විය.

# වැඩිවියට පත්වීම සහ ඔසප් වීම සම්බන්ධ ගැටලු



## වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි

### ? වෛද්‍යතුමනි, ගැහැණු දරුවෙක් වැඩිවියට පත්වීම ලෙස හඳුන්වන්නේ කුමක්ද?

පළමු වරට ඩිම්බ කෝෂයකින් ඩිම්බයක් පිටවීමත් සමඟ, ඊට පසුව ඇති වන පළමු ඔසප් වීම ලෙස සරලවම කිව හැකියි. එතැන් පටන් ඇය ගැබ් ගැනීමට මූලික සුදුසුකම් සපුරනවා. නමුත් මෙය ඊට යෝග්‍ය වූ කාලය නොවේ. සාමාන්‍ය වයස් කාණ්ඩය අවුරුදු 11 සිට 13 අතර වේ.

### ? පිරිමි ළමුන් වැඩිවියට පත්වීම යනු කුමක්ද?

වෘෂණ කෝෂ තුළ වෘෂණවලින් ශුක්‍රාණු නිපදවා අනෙකුත් ආශ්‍රිත ග්‍රන්ථිවල ස්‍රාවයන් සමඟ ශිශ්නය ඔස්සේ බාහිරට මුදා හැරීම ලෙස සරලවම හැඳින්විය හැක. එතැන් පටන් ඔහු දරු කලලයක් සෑදීමට මූලික සුදුසුකම ලබා ගන්නවා. සාමාන්‍ය වයස් කාණ්ඩය වන්නේ අවුරුදු 12 සිට 16 අතරයි.

### ? මෙම සිදුවීම ජීව විද්‍යාත්මකව පැහැදිලි කළොත් ?

ගැහැණු හා පිරිමි දෙපිරිසගේම මොළයේ හයිපොතැලමස මඟින් ස්‍රාවය කරන LHRH හෝමෝනය මඟින් පිටියුටරි ග්‍රන්ථිය උත්තේජනය කරනු ලබනවා. එවිට පිටියුටරි ග්‍රන්ථිය මඟින් LH, FSH හෝමෝන දෙක ස්‍රාවය කරනවා. පිරිමි ළමුන්ගේ LH, FSH හෝමෝන වෘෂණ මත උත්තේජනය ඇති කරනවා. ඒ මඟින් ශුක්‍රාණු නිපදවීමත්, පිරිමි ද්විතීයික ලිංගික ලක්ෂණවලට හේතු වන ටෙස්ටොස්ටෙරෝන් නම් හෝමෝනය නිපදවීමත්, ආශ්‍රිත ග්‍රන්ථිවල ස්‍රාව නිපදවීමත් සිදු වෙනවා .

ගැහැණු ළමුන්ගේ LH, FSH හෝමෝන මඟින් ඩිම්බ කෝෂ මත උත්තේජන ඇති කරනවා. ඒ මඟින් ඩිම්බ වර්ධනය වීම, ඩිම්බ මෝචනය, කාන්තා ද්විතීයික ලිංගික ලක්ෂණවලට හේතු වන ඊස්ට්‍රජන් හා ප්‍රජෙස්ටරෝන් නම් හෝමෝන නිපදවීමත් සිදුවෙනවා.

ගැහැණු ළමුන්ගේ ඩිම්බ මෝචනයත්, ඔසප් වීමත්, ඩිම්බ කෝෂවල හා ගර්භාෂයේ චක්‍ර දෙකක් ලෙස මාසිකව සිදුවෙනවා. එහි දී මාසිකව යෝනි මාර්ගයෙන් රුධිරය පිටවීමක් සිදුවෙනවා. මෙහි දී රුධිරය පිටවෙන්නේ ගර්භාෂයේ ඇතුළු බිත්තිවල පටක කැඩී බිඳී යාම හේතුවෙනි.

### ? ආර්තවය හෙවත් ඔසප් වීම සම්බන්ධ ගැටලු පිළිබඳව ඊළඟට කතා කරමු.

ආර්තවය පිළිවෙළට සිදුනොවීම බරපතළ ප්‍රශ්නයක් ලෙස බොහෝ ගැහැණු ළමයි සලකනවා.

ආර්තවය පටන් ගැනීමේ සිට අවුරුදු 4ක් 5ක් පමණ යන තෙක් ආර්තවය අපිළිවෙළට සිදුවීම, නියමිත දිනටම සිදුනොවීම අස්වාභාවික නැහැ. සාමාන්‍යයෙන් ආර්තව චක්‍රය දින 28කට වරක් සිදුවේ. මෙය දින කීපයකින් අඩු හෝ වැඩිවෙන්න පුළුවන්. මුල් අවුරුදු 4 හෝ 5 ගිය පසුවත් විශාල වශයෙන් දිගින් දිගටම අක්‍රමිකතා ඇති වන්නේ නම් (උදාහරණයක් ලෙස මාස 3කට වරක්) නාරිවේද රෝග සායනයට ගොස් වෛද්‍යවරයෙක් සමඟ සාකච්ඡා කළ යුතුයි. පරීක්ෂා කරගත යුතුයි.

අස්වාභාවික තත්වයක් ප්‍රජනක පද්ධතියේ ඇත්දැයි බැලීමට ABDOMINAL SCAN පරීක්ෂණය සිදුකරනවා. මෙයට බිය විය යුතු නෑ. මෙය විනාඩි 2 - 3 අතර කාලයක් තුළ සායනයේදීම සිදුකරන සුළු පරීක්ෂණයක්.

එමඟින් ගර්භාශය, ඩිම්බ කෝෂවල පිහිටීම නිවැරදිව තිබේදැයි බැලීමක් හා ඒවායේ රෝගී තත්වයක් ඇත්දැයි සොයා බැලීමක් සිදුකරනවා. බොහෝවිට බොහෝ දෙනෙක්ගේ අස්වාභාවික තත්වයක් සොයා ගැනෙන්නේ නෑ. එහෙත් එමඟින් හිතේ මතුවන සැක දුරුකර ගන්න පුළුවන්.

### ? මෙම අක්‍රමිකතා සාමාන්‍ය වන්න පුළුවන්ද?

ඔව්. මුල්කාලයේදී සාමාන්‍ය වන්න පුළුවන්. ඒවාට හේතු ලෙස, වෙනත් කායික රෝග තත්වයක්, මානසික ආතතීන් හෝ පීඩාකාරී තත්වයක්, වෙනත් රෝග සඳහා ගන්න ඖෂධ හේතුවෙන්න පුළුවන්. ඒ වගේම සිරුරේ බර අධික වීම, ඉතා ඉක්මනින් අධිකව බර අඩුවීමත් හේතුවෙන්න පුළුවන්. මෙවැනි තත්වයන් පවතී නම් කලබල විය යුතු නෑ.

### ? Polycystic ovarian syndrome (PCOS) ගැන පැහැදිලි කළහොත්

ඔසප් චක්‍රයේ අක්‍රමිකතා වීමට බහුලව හඳුනාගත හැකි හේතුවක් වන්නේ මේ රෝගී තත්වයයි. මේ රෝගයේදී ඩිම්බ කෝෂවල සිස්ට් හෙවත් ගෙඩි ඇති වෙනවා. බාහිර රෝග ලක්ෂණ ලෙස අධික ස්ථුලතාව, මුහුණේ අසාමාන්‍ය රෝම වර්ධනය දක්නට ලැබෙනවා. සමහරු සිතනවා මෙවැනි රෝගීන්ට ගැබ්ගැනීමක්



සිදුවන්නේම නෑ කියලා? එය වැරදියි. ලබාදෙන උපදෙස් හා ප්‍රතිකාර නිවැරදිව කළ යුතුයි. අධික ස්ථුලතාව පාලනය කිරීම, ව්‍යායාම කිරීම, අධික පිෂ්ටමය ආහාර ගැනීම අඩු කිරීම හා කෙඳි සහිත ආහාර, එළවළු, පළතුරු ගැනීම සිදුකළ යුතුයි.

### ? ආර්තවය සම්බන්ධ වෙනත් ගැටලු මොනවාද?

වේදනාකාරී ආර්තවය හෙවත් Dysmenorrhoe හැමෝටම ඇති වන්නේ නැත. නමුත් එය සුලබ තත්වයකි. බොහෝ අවස්ථාවලදී මෙය ප්‍රශ්නයක් නොවේ. අපි මෙය ප්‍රාථමික හා ද්විතීයික ලෙස දෙකොටසකට බෙදනවා. බොහෝ තරුණියන්ගේ දක්නට ලැබෙන්නේ ප්‍රාථමික තත්වයයි. එය බරපතල නැත. ස්වාභාවිකයි. මෙහිදී ප්‍රජනක පද්ධතියේ වෙනත් රෝග තත්වයන් දක්නට ලැබෙන්නේ නෑ. මල්වර වී මුල්කාලයේදී ඇති වන මේ ප්‍රාථමික තත්වයේ ලක්ෂණ වන්නේ එය ආර්තවය ඇති වීමත් සමඟ හෝ එම දින ගණනට සීමාවීමයි.

ද්විතීයික ආර්තව වේදනාවට හේතු වන්නේ ප්‍රජනක පද්ධතියේ රෝගී තත්වයක්. එය අවුරුදු 30-40 කාලයේදී ඇති වන්නට පුළුවන්. බොහෝවිට ආර්තව සමයේ අවසන් කාලයේදී මෙම වේදනාකාරී තත්වය හටගන්නවා. මෙහිදී සඳහන් කළ හැකි රෝගී තත්වයන් වන්නේ endometriosis, adenomysis, PID හෙවත් කල්ගත උදර ආබාධ, endometrial polyps හෙවත් ගර්භාශයේ ඇතුළු බිත්තියේ සුළු ගැටිති වේ. මෙහිදී වෛද්‍ය උපදෙස් හා ප්‍රතිකාර ලබාගත යුතුයි.

### ? මේ dysmenorrhoea තත්වයේ දී වේදනානාශක ගැනීම සුදුසු නැද්ද?

පැරසිටමෝල් පෙත්තක් හෝ ගැනීම සුදුසු නෑ යන්න මිත්‍යාවක්. වේදනානාශක ගත යුතුයි. බොහෝ දෙනාට පැරසිටමෝල්වලට වේදනා අඩුවෙනවා. නමුත් එසේ අඩු නොවුනහොත් වෛද්‍ය උපදෙස් මත වෙනත් සුදුසු වේදනානාශක (මෙෆනමික් ඇසිඩ් වැනි) ගතහැක.

වේදනාව සමඟ එන වමනය, ඔක්කාරය, ඇඟ පණ නැතිවීම වැනි තත්වයන්වලට ඊට සුදුසු ඖෂධ ලබාගත හැක. උදාහරණයක් ලෙස වමනය පාලනයට domperidone වැනි ඖෂධ ගන්න පුළුවන්. මෙහිදී විශේෂයෙන් කිව යුතු දෙයක් නම්, කලින් පැවති වේදනා ස්වභාවය වෙනස් වී ඇත්නම් හෝ, මේ දක්වා භාවිතා කළ ඖෂධ ප්‍රමාණවත් නොවේ නම් හෝ වෛද්‍ය උපදෙස් ලබාගත යුතු වෙනවා.


ඉදිරි ලිපි තුළින් ගැබ් ගැනීම, සරුකාලය, උපත් පාලනය වැනි කරුණු සාකච්ඡා කරමු.

සටහන: වෛද්‍ය රිසිනි විල්මා

# කුඹියෝ ජාත්‍යන්තරයෙන් 1ට

මේ දිනවල පුංචි තිරයේ ඉතා ජනප්‍රිය ටෙලිනාට්‍යයක් බවට "කුඹියෝ" පත් වී ඇත. ඒ විතරක් නොව ජාත්‍යන්තර IMDB වෙබ් අඩවිය මඟින් කළ සමීක්ෂණයකින් ද කුඹියෝ ටෙලි නාට්‍ය අංක එක බවට පත් වී ඇති බව පසුගිය දා වාර්තා විය.

IMDB (The Internet Movie Database) යනු ලෝකයේ චිත්‍රපටි, ටෙලිනාට්‍ය, ක්‍රීඩා ආදී විස්තර ඇතුළත් වෙබ් අඩවියක් වේ. එහි සාමාජිකයන්ට එහි ඇති TV series, Movie, Game යන




ඕනෑම එකකට තමන්ගේ මතය ඉදිරිපත් කළ හැකියි. එම මත මඟින් හොඳම නිර්මාණය තෝරනවා. ඒ අනුව IMDB වෙබ් අඩවියේ පසුගිය දා තෝරපු නිර්මාණ අතරින් කුඹියෝ ටෙලිනාට්‍යය පළමු ස්ථානය බවට පත් විය. ඒ ලෝකයේ ජනප්‍රිය ටීවී සීරීස් එකක් වන Crime TV Series එක දෙවන ස්ථානයට පත් කරමිනි.

# සංවර්ධන අනාථයින් බිහිකළ ඔලුවිල් වරාය ව්‍යාපෘතිය



මිනිස් අවශ්‍යතා තෘප්ත කරගැනීම වෙනුවෙන් සොබාදහම වෙනස් කළ යුතු බව සංවර්ධනය පිළිබඳව ඇති ප්‍රභල මතයකි. මෙහි අර්ධ සත්‍යයක් නැතුවාම නොවේ. ගෙවුණු සියවසේ ලෝකයේත් අප රට තුළත් සංවර්ධනයේ නාමයෙන් වූ ව්‍යාපෘති මෙතෙක් ක්‍රියාත්මක වුණේ ඉහත සඳහන් තර්කයට අනුවය.

ස්වභාදහම පවතින්නේත් ක්‍රියාත්මක වන්නේත් නියාමයන් අනුව බවත් එම නියාමයන් වෙනස් කිරීමකට ලක්වන විට ස්වභාදහමේ පැවැත්මේ රිද්මය මුළුමනින්ම බිඳවැටී මිනිස් ජීවිතත් සමඟම භයානක අවසානයකට ළඟා වන බවත් පසුගිය අත්දැකීම්වලින් අප දැක තිබේ.

උමා ඔය ව්‍යාපෘතිය, පෝට්සිටි, අධිවේග ව්‍යාපෘති හා අසාර්ථක ඔලුවිල් වරාය ව්‍යාපෘතිය යනු එවැනි ඒවාට උදාහරණ කිහිපයකි.

ඔලුවිල් වරාය යනු මුස්ලිම් ජාතිවාදී නායකයින්ට කප්පමක් ලෙස පිරිනැමූ සුදු අලියෙකි. රුපියල් මිලියන 7000ක ඩෙන්මාර්ක් රාජ්‍යයේ ණය මුදලකින් ඉදිකරන ලද මෙය 2008 නැගෙනහිර නවෝදය යනුවෙන් බැසිල් රාජපක්ෂ විසින් රඟ දැක්වූ ව්‍යාපෘතිය හා සම්බන්ධිත එකකි. පළමු වන අදියර යටතේ දියකඩන දෙකක්ද දෙවන අදියර යටතේ එය ටොන් 16000 බරැති යාත්‍රා හැසිරවිය හැකි ලෙස සංවර්ධනය කිරීම ද සිදුවිය.

මෙම ඉදිකිරීම සිදුකළ නගර ප්‍රදේශ තුළ දියවැල් 04ක් ක්‍රියාත්මක බව එහි වෙසෙන ධීවර ජනතාව පවසයි. ඒ ගොඩබිම සිට දියඹට, දියඹ සිට ගොඩබිමට සහ මුහුද දෙපසම ආදී ලෙස වේ. මෙවැනි දියවැල් සහිත ක්‍රියාකාරීත්වයකින් යුතු මුහුදු ප්‍රදේශයක මහා පරිමාණ ඉදිකිරීම් කළ පසු ස්වභාදහමේ පැවැත්මේ නියාමයන් බිඳ වැටී රළ පෙරළා පහර දීම අරඹයි. 2013 වසරේ සැප්තැම්බර් 01 දින මහින්ද රාජපක්ෂ අතින් විවෘත වූ ඔලුවිල් වරාය නිසා,


01.වරාය සිට උතුරු දෙසට වෙරළ ආශ්‍රිතව මීටර් 500 ක් පමණ ගොඩබිම තුළට වෙරළ ඛාදනයවී තිබේ. මීට වසර15 කට පමණ පෙර මුහුදට සමාන්තරව ගොස් සාගරයට වැටෙන ඇළ මාර්ගයක් තිබිණි. අද වනවිට එම ඇළත් සාගරයට එකට යාවී ඒ දෙක අතර තිබූ ගොඩබිම් කොටස අතුරුදන්ව තිබේ.

02. වෙරළ ඛාදනය නිසා, ධීවර ජනතාවට තම ධීවර බෝට්ටු, ආරක්ෂා කර ගැනීමට නොහැකි තත්වයක් ඇතිව තිබේ. නාවුක කටයුතු සඳහා ඉදිකළ වරායේ ජැටිය ධීවර බෝට්ටු සඳහා භාවිතා කළ හැකි නොවේ.

03. වරාය තුළ වැලි ගොඩගසා ඇති නිසා එය ඉවත් කිරීමෙන් තොරව වරාය තුළ භූමිය භාවිතා කළ නොහැකි තත්වයක තිබේ. එය විවෘත කර මේ දක්වා කිසිඳු නැවක් පැමිණ නොමැති අතර අංගසම්පූර්ණ ලෙස නවීන තාක්ෂණය සහිතව ඉදිකළ වරාය කිසිඳු ප්‍රයෝජනයක් නොමැතිව අතහැර දමා ඇත. එහෙත් මේ විනාශය අවම කරමින් ගොඩගැසී ඇති වැලි ඉවත් කර ධීවර බෝට්ටු, බහුදින යාත්‍රා නැවත්විය හැකි තැනක් ලෙස හෝ පවත්වාගෙන යා හැකි වන සේ ප්‍රතිසංස්කරණය කළ යුතුය.

රටේ භූමියෙන් මීටර් 500ක පමණ ප්‍රදේශයක් මුහුදට බිලි දෙමින් හා සම්ප්‍රදායික ලෙස ධීවර කර්මාන්තයේ නියැළුණු අයට තම ධීවර බෝට්ටු නවතා තැබිය හැකි ස්ථාන අහිමි කරමින් රුපියල් මිලියන 7000ක මුදලක් විනාශ කරමින් සිදුකරන ලද මෙම ඔලුවිල් වරාය සංවර්ධන ව්‍යාපෘතිය යනු රාජපක්ෂ පාලනය තුළ සිදුකළ රටට බරක් වූ තවත් එක් සුදු අලියෙක් පමණක් බව කණගාටුවෙන් වුවත් ලියා තැබිය යුතුය.

# A Beautiful Mind



දෘශ්‍යමාන විශ්වය තුළ අදෘශ්‍යමාන ක්වොන්ටමය දක්වා සියලු සත්‍යයන් විස්තාරණය කිරීමට හැකි වූයේ නම් ඒ අපූර්ව මිනිස් මනසටය. සැබෑවටම එය ද අසිරිමත් මනසකි. පරෙවියන්ගේ ආහාර රටාව, පාපන්දු ක්‍රීඩකයන්ගේ ක්‍රීඩා විලාශය වැනි සියුම් අවස්ථා තුළ පවා වෙනස්ම වූ අපූර්ව රටා ගොඩනග න්නට ඔහු සමත් වන්නේ එබැවිනි. පංති කාමරයක දේශනවලට සීමා වූ අධ්‍යාපනය අප්‍රිය කළ ඔහු, පාඩම් උගත්තේ සොබාදහමෙනි. ප්‍රායෝගික ජීවිතයේ අත්දැකීම් තුළිනි. මෙලෙස ලොව ප්‍රගමනයට සිය හැකියාවන් එක්කරමින් 1994 වර්ෂයේ දී ආර්ථික විද්‍යාව සඳහා නොබෙල් ත්‍යාගය ද 2015 දී අබෙල් සම්මානයෙන් ද පිදුම් ලැබූ ඒ ශ්‍රේෂ්ඨ ගණිතඥයා ජෝන් ෆොරබ්ස් නෑෂ් ය. A Beautiful Mind යනු ඔහුගේ ජීවිත කතාව වටා ගෙතුණු අපූර්ව චිත්‍රපටයකි.

කොළොම්බියානු සරසවියේ ආචාර්ය සිල්විියා නසාර් විසින් රචිත A Beautiful Mind නමැති ග්‍රන්ථය අනුසාරයෙන් නිෂ්පාදනය කළ මෙම චිත්‍රපටය රොන් හෝවර්ඩ්ගේ අධ්‍යක්ෂණයකි. එය විනාඩි 135ක් පුරා චරිත කිහිපයක් ඔස්සේ දිගහැරේ.

ජෝන්ගේ ගමන එතරම් පහසු එකක් නොවී ය. ඒ බාහිර ලෝකය සමඟ මෙන්ම ඔහුට ඔහුගේ මනස සමඟ ද සටන් කිරීමට සිදුවූ නිසාය. ඔහු Paranoid Schizophrenia නම් මානසික ව්‍යාකූලතාවයකින් පසුවිය. නිතරම ජීවත් වූයේ මනඃකල්පිත ලෝකයක මනඃකල්පිත චරිත සමඟිනි. එකී චිත්‍රපටය තුළ මනඃකල්පිත වටපිටාව ප්‍රේක්ෂකයා අභිමුව ද නිර්මාණය කෙරන්නේ ඉතා සූක්ෂම අයුරිනි. ජෝන්ගේ ආදරණීය කාමර සගයාවූ චාල්ස් ද එවැනිම වූ මනඃකල්පිත චරිතයකි. සමාජ ආශ්‍රය නුපුරුදු වූ ජෝන්ව තවදුරටත් හුදෙකලා නොකරමින් සැබෑ මිතුරෙකු ලෙස චාල්ස් චිත්‍රපටය තුළ ඉස්මතු වෙයි. ජෝන්ගේ සැබෑ ලෝකයේ අත්වැල වූයේ ඔහුගේ දයාබර බිරිඳ ඇලීසියා ය. දුෂ්කර ගමනක අතිදුෂ්කර වූ අවස්ථාවලදී පවා ජෝන්ව අතනොහරිමින් ඇය ඔහු සමඟ රැඳෙන්නට විය. තවදුරටත් ගණුදෙනුවක් නොවන ආදරය හා විශ්වාසය මත ගොඩනැගී සැබෑ මානුෂීය බැඳීම් සමඟ ගෙතුණු A Beautiful Mind චිත්‍රපටය සාර්ථක නිර්මාණයක් ලෙස හැඳින්විය හැකිය.

# සරදියෙල්ගේ කොලම

හම්බන්තොට පොලිස් ලොක්කෙක්, කොල්ලෙක්ට ගහනවා කන පැලෙන්න. සරදියෙල් පරපුරේ එකෙක් ළඟ හිටියනම්, අම්මපා ගහනවා අනිත් පැත්තට පොලිස්කාරයව ඇදගෙන වැටෙන්න. කොහෙද, අර තරුණයා ජාතියේ ලොකු බේබි එක්කනේ ගිහින් තිබ්බේ පිකටි කරන්න. නොදකින් විතරක්! බලේ ඉන්නකන් කෙල්ලො අමාරුවේ දානවා. මොනවා වුණත් අත් දෙකම පොලිස්කාරයෝ දෙන්නෙක් අල්ලං ඉද්දි කනට ගහපු පොලිස් ලොක්කට නම් පාඩමක් උගන්වන්නම ඕනි.

හම්බන්තොට පිකටි එකේදී කොල්ලෝ දියාරු විදිහට හැසිරුනාට කොළඹ තිබ්බ ඇන්ටි සයිටම් පිකටි එකේදී කොල්ලෝ හරි හරියට කඳුළු ගෑස් උණ්ඩ අතට අරගෙන ආයේ පොලිස්කාරයින්ටම ගහන දිහා සරදියෙල් බලා සිටියේ තරමක සතුටින්. මුලින් කැම්පස්වල කොල්ලෝ කෙල්ලො විතරක් හිටිය ඇන්ටි සයිටම් පිකටිවලට දැන් උන්ගේ තාත්තලා අම්මලාත් එකතු වෙලා තිබුණා. ජේන විදිහට ජහපාලනේ සල්ලං වෙන්නෙත් ඔය ප්‍රශ්නෙන්ම තමයි.

බැඳුම්කරේ හොරු අල්ලන්න හිටන් දාපු විමර්ශන කොමිසම දිහා රටම බලන් ඉන්නේ. සුද්දො වගේ ටයි කෝට් දාපු සෙට් එක දීලා තියෙන්නෙ ලෙහෙසි පහසු සුද්දයක් නෙවෙයි. හැබැයි ඔය කොමිසමට පුළුවන්, වෙච්ච දේ ගැන සාක්කියත් එක්ක වාර්ථාවක් සපයන්න විතරයිලු. එතනින් එහාට, සතුටු වෙන්න පුළුවන් හොඳ වැඩක් කෙරෙයි කියලා, සරදියෙල් විශ්වාස කරන් නෑ. කවදා හරි ඔය හොරකම් කරපු ධනස්කන්දේ, ජනතාවට අරන් දෙන්න වෙන්නේ සරදියෙල්ලටම තමයි.

2018 අය වැය යෝජනාව නොවැම්බර් මාසේ එනවා. හිටං ලොක්කගේ වියදම්, රනිල් හාමු මහත්තයාගේ වියදම් වැඩි කරන්න යෝජනා කරලා. සරදියෙල් හැමදාම ආදරය කරපු සාමාන්‍ය ජනතාවට පටි තද කරගන්න කියලා, කාලකණ්නි ලොක්කො සෙට් එක මොකටද එන්නේ කියලා සරදියෙල් බොහෝම සීරුවෙන් බලාගෙන ඉන්නේ.

නූතන සරදියෙල්








# 19 වන ලෝක තරුණ
# රුසියා































The Gadget

# ලොව ප්‍රථම විද්‍යුත් මී වදය නිපදවයි

පාකිස්තානු තරුණයකු වන මොහොමඩ් සහහීර් නියාසිස් විසින් පසුගියදා ඉතා වැදගත් පර්යේෂණයක නිරත වෙමින් සාර්ථක ප්‍රතිඵල ලබාගෙන ඇත. වයස අවුරුදු 17ක් වන මොහු විවිධ විද්‍යාත්මක පරීක්ෂණවල නිරත වන අතර විද්‍යාඥයකු ලෙස පිළිගැනීමට ලක්වී ඇති බව මාධ්‍ය වාර්තා කරයි.

ඔහුගේ නවතම පරීක්ෂණය මඟින් විද්‍යුත් මී වදයක් (හය පට්ටම්) නිපදවීමට හැකි විය. මේ සංසිද්ධිය පිළිබඳව දශක ගණනාවක සිට භෞතික විද්‍යාව තුළ ප්‍රකාශ වී ඇත. නමුත් සහහීර් නියාසිස් තරුණ විද්‍යාඥයා විසින් ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයක් තුළ



එම විද්‍යුත් මී වදය, යකඩ අයන තුළින් සෑදීමට සලස්වා ඡායාරූපගත කිරීමත් එම ක්‍රියාවලිය තුළ ගොඩනැගෙන තාපය වාර්තාගත කිරීමට සමත් වීමත් විශේෂයක් වී ඇත.

රුසියාවේ පැවති තරුණ භෞතික විද්‍යා තරඟාවලියක් තුළ දී මෙම සංසිද්ධිය ක්‍රියාවට නගා ඇති අතර එහි ප්‍රතිඵලය විද්‍යාඥයන්ගේ ඇගැයීමට ලක් වී ඇති බවද ප්‍රකාශ වේ.

මෙම විද්‍යුත් මී වද සංසිද්ධිය මුළු විශ්වයේම සමතුලිතතාව පෙන්නුම් කරන ප්‍රබල සාධකයක් වී ඇති බව නියාසිස්ගේ අදහසයි.

අධි වෝල්ටීයතාවයකින් යුත් ඉලෙක්ට්‍රෝඩ දෙකක් අතර තුනී තෙල් තට්ටුවක් සහිත යකඩ පෘෂ්ඨයක් මත විද්‍යුතය ගමන් කිරීමට සැලැස්වීමෙන් මෙම පර්යේෂණ ප්‍රතිඵලය ලබාගත් බවද ඔහු ප්‍රකාශ කර සිටී.


එසේම මුද්‍රණ කටයුතුවලදී මෙන්ම ජෛව ඖෂධ නිෂ්පාදනයේදී ද මෙම පර්යේෂණ, වඩාත් ප්‍රතිඵලදායක ලෙස යොදාගැනීමට හැකි බව විද්‍යාඥයින්ගේ මතයයි.


# facebook එකට ආපු අලුත්ම Update එක


ෆේස්බුක් එකට පසුගිය දවස්වල අලුත්ම අප්ඩේට් එකක් ආවා. ඒ "Explore Feed" කියන එක. ෆේස්බුක් ආයතනය කියන විදිහයට මින් පස්සේ page වලට දාන පෝස්ට්, කාගෙවත් වෝල්වල පෙන්වන්නේ නැහැ. ඒ කියන්නේ පේජ්වල පෝස්ට් බලන්න Explore Feed යන්නම වෙනවා. ඔවුන් පවසන්නේ මින් පස්සේ fb භාවිතා කරන අයට මෙය පහසුවක් වෙයි කියලයි.

නමුත් පේජ් කරන අයට නම් මේක එච්චර සුභ පණිවිඩයක් නෙවෙයි. මොකද මේකෙන් පස්සේ පේජ්වල දාන පෝස්ට් සියල්ලම කලින් වගේ News Feed වල පේන්නේ නැති නිසා. ඒ නිසා පේජ් රීච් එක අඩුවෙන්නත් පුළුවන්.

මේ අලුත් අප්ඩේට් එක හොයා ගන්න එච්චර අමාරු නැහැ. ඔබේ facebook එකේ News Feed තිබුණු තැන මතකද? fb එකේ වම් පැත්තේ තමයි News Feed තියෙන්නේ. එතකොට Explore Feed තියෙන්නෙත් වම්පැත්තේ. හරියටම News Feed වලට පහළින්, රොකට්ටුවක් වගේ අයිකන් එකකින් බලාගන්න පුළුවන්.






Sports

# අහෝ මෙවන් උළෙල කුමට

43 වන ජාතික මළල ක්‍රීඩා උළෙල, යොවුන් ජාතික ක්‍රීඩා උළෙල හා පාසල් මළල ක්‍රීඩා උළෙල යන උළෙල ත්‍රිත්වයම පසුගිය දා නිමා වූයේ මළල ක්‍රීඩාව මෙන්ම මළල ක්‍රීඩා සංගම් ද උඩුයටිකුරු කරමින් ය.

ජාතික මළල ක්‍රීඩා උළෙල පැවැත්වූයේ මාතර කොටවල ක්‍රීඩා පිටියේදීය. එම ක්‍රීඩා පිටිය තෝරාගත්තේ ද පහසුම් ගැන හෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පහසුව ගැන හෝ සිතා නොවේ. හුදෙක්ම දේශපාලඥයින්ගේ බලපුළුවන්කාරකම් පෙන්වීමට ය. එය මනාවට ඔප්පු වූයේ ධාවන පථය හා පැනීමේ ඉසව් සූදානම් කර ඇති ස්ථානයන් දැක ගැනීමෙන් ය.

අනෙක් කාරණය නම් ජාතික මහා ක්‍රීඩා උළෙල යනු දේශීය ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ඔලිම්පික් ක්‍රීඩා උළෙල වැනි ය. නමුත් එය පැවැත්වූයේ ද බොහෝ ජාතික හා ජාත්‍යන්තරය දිනූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් නොමැතිව ය. මෙම තරඟාවලිය සංවිධානය කළ දිනවලම යුධ හමුදා මළල ක්‍රීඩා උළෙලත්, ආසියානු ගෘහස්ථ මළල ක්‍රීඩා උළෙලත් ආරම්භ වී තිබිණි. නිමාලි ලියනාරච්චි මීටර 800 ආසියානු ශූරිය යි. ඇය හා රුමේෂි රත්නායක ජපානයේ පුහුණු වැඩමුළුවක් සඳහා සහභාගී කරවා තිබිණ. ඉඳුනිල් හේරත් ආසියානු ගෘහස්ථ මීටර 800 රිදී පදක්කම්ලාභියායි. ඔහු ද ආසියානු ගෘහස්ථ තරඟාවලියට සහභාගී වී තිබිණ. මේ නිසා ඔවුන්ට බොහෝ තරඟ මඟහැරුණි. එමෙන්ම නිමාලි හා ඉඳුනිල් 23 වනදා පෙ.ව. 7ට මෙරටට පැමිණ



එදාම පෙ.ව. 10ට සූදානම් කර තිබූ මීටර 800 තරඟ ඉසව්වට සහභාගී වූහ.

පාසල් මළල ක්‍රීඩා උළෙල දියගම දී පැවැත්වූයේ ද ගැටලු රැසක් මැදය. එහි විශේෂතම ගැටලුව වූයේ වයස් සීමාවන් වෙනස් වීමයි. මෙතෙක් අවසාන වයස් සීමාව වූ 21න් පහළ, 20න් පහළ ලෙස වෙනස් කර තිබිණි. මේ නිසා බොහෝ ක්‍රීඩකයින්ට අවස්ථා අහිමි වීමත් මෙතෙක් තිබූ තරඟ වාර්තාවල වටිනාකම ශූන්‍ය වීමත් සිදුවිණි.

ජාතික යොවුන් ක්‍රීඩා උළෙලද මෙයට ම නොවෙනස් ය. එහි ප්‍රධානම ගැටලුව වූයේ මෙම ක්‍රීඩා උළෙල පැවැත්වූ අනුරාධපුර, සල්ගාදු ක්‍රීඩා පිටිය ඌරු කොටුවකට සමාන වීමය. ඒ නිසාම එහි එකදු තරඟාවලි වාර්තාවක්වත් තැබීමට නොහැකි විය. ධාවන පථය වැස්සෙන් යට වූ කුඹුරක නියරක් සේද පැනීමේ තරඟ පැවැත් වූ ස්ථාන වගුරු බිමක ස්වරූපයක්ද ගැණිනි. එමෙන්ම ජාත්‍යන්තර පදක්කම්ලාභීන්ට මෙහිදී හිමිවූයේ හතර හෝ පස්වන ස්ථානයන්ය.



මෙතෙක් අප රටට ලබාගැනීමට හැකි වී තිබෙන ඔලිම්පික් පදක්කම් ගණන දෙකකි. නමුත් අපට වඩා දිළිඳු, සම්පත් අඩු, ජනගහනය අඩු රටවල් පවා අපට වඩා පදක්කම් ලබාගෙන ඇත. ඔලිම්පික් උළෙල සඳහා ක්‍රීඩකයින් හඳුනා ගැනෙන්නේ ජාතික, යොවුන් හා පාසල් ක්‍රීඩා තරඟාවලි මඟින්ය. එම තරඟාවලි පවත්වන්නේ දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් නොමැති ව නම්, මඩ සහිත වගුරු බිම්වල නම්, දේශපාලකයින්ගේ හිතුවක්කාරකම් මත නම් අපේ රටේ ඔලිම්පික් පදක්කම් සිහිනය තවදුරටත් සිහිනයක් ම වනවා නොඅනුමානය.

නමුත් මෙවර අයවැයෙන් ගිය වසරට සාපේක්ෂව ක්‍රීඩා අමාත්‍යාංශයට වැඩි මුදලක් වෙන්විය. එම වෙන්වූ මුදලින් වැඩි ම මුදලක් වෙන්කර තිබුණේ ද ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමටය. දැන් වසරක් ගෙවීමට ආසන්නය. නමුත් තවමත් ක්‍රීඩා තරඟ පවත්වන්නේ වගුරුබිම්වලය. වෙන් කළ මුදල් කොමිස් කාක්කන්ගේ, දේශපාලුවන්ගේ හා සමහරක් ක්‍රීඩා බලධාරීන්ගේ සාක්කුවලට යන විට ක්‍රීඩාවේ අනාගතය ගැන තවදුරටත් සිහින දැකීම මුලාවක් වී ඇත.

# කවි නිර්මාණය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**

ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන්කරන්න.
මෙන්න අපගේ ලිපිනය

*FORWARD කවිපිටුව,
අංක 464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.*

## ෆැක්ටරි මෝලෙ ඇඹරෙන ඉස්කෝලෙ අන්තිම දවස්

කොලිප්ජ් හීන වැල් ඉහිරුණා ගම තුළ
තුටු වේවී පුංචි අත් ඉගිලුනා පුර දොර
දූලි බැස නැවතුණා පාළු වූ පුටු උඩ
හැඬුම්බර සිනා මුව දෙක තුනකි තැන තැන

පරණ කොසු පරඬැල්ය පන්තිවල මුළුවල
මකුළු දැල් ගෙත්තම්ය කම්බි දැල් කොටු මත
මළාක් මෙන් නිදන බැල්ලකගේ පා ළඟ
කොලාජ් සිත්තමකි හුළඟකින් ගිලිහුණ

දඩි බිඩියෙ අරන් පොඩි ඉස්කෝලෙ ඉරණම
දුබල කොඩි මැඩ ලියුම් පා වුණා සිවි දිග
කඩිනමින් එවා ඇත ඉබි යතුරු දම්වැල
අව්වු කොළ ඇළවුණා ගේට්ටුවේ කණුවල

පෝලිමේ එන්නෙ අර බකුසු කහ බැකෝ රථ
දත් කමින් නංවමින් යකඩ සක් යක් හඬ
තලනු ඇත තුන හතර ශ්‍රේණි පෙළ පළමුව
උගුල්ලාවිද පුංචි බුදු මැදුර - ටැප් එක

කැකුළු පා ලකුණු ඇති සුදු මිදුල යට කර
පහළ වෙනවලු මෙතැන ෆැක්ටරිය සවි බල
ළමයිනේ ඉතින් පොඩි පාසලේ සිප් ලද
උඹලටත් ලැබෙයි ඒ ෆැක්ටරියෙ වැඩපළ

*ලක්ෂාන්ත් අතුකෝරළ
"සමහර කමටහන්"*

## වසන්තය...

පිපෙන්නට දින ගණින
පුංචි මල් කැකුළකට,
වසන්තය නොවේ මේ
සුවඳ විදහා පෙති හරින්නට
නිදහස් මඳනලේ
නැළවී සැනසෙන්ට
විහඟ ගී රාවයෙන්
මත් වී රඟන්නට...
ඉරිතලා ගිනියම්ව
කාෂ්ට වූ ඉඩෝරේ
හිරු දකින්නට වේවි නුඹට
දළ විසෙන් පිරවූ
රොනට එන බඹරුන්ට
නොරුවටී ඉන්න වෙයි නුඹට...
හඬ නගාපන්
අහස් ගුගුරා වැසි වැටෙන්නට
විස පිරුණු බඹරුන්
පැලී මිය යන්ට
දහක් මල් ඇහැරේවි
නුඹේ ඒ හයියට
පරනොවී පිපීයන්
වසන්තය එනවා අත ළඟම...

*-හිරුමාලි දිසානායක-*



## ඇත්ත තිත්තයි..

*හන්දියේ ලෑල්ලක
හිනාවෙන රතු පාට
එන ගමන් අත වැනුවා
ඇත්තයි..!
ලඹය
මේසන් හැන්ද
බුම්මගත් දවස්වල
පොඩි පුතේ
රඹුටනුත් තිත්තයි..!*

*FB ඇසුරෙන්*

## ලෙච්චමී අම්මා



**විසිරුණු තේ දළු
අඳුනනවා ඇති
නුඹ ඇඟිලි පහස
සුසුමන්, දහදිය
නුඹ හෙළූ...
වැහි ළිහිණියන්
අහසට වන්
හඬා වැටෙනවා ඇති
ඒකයි මේ කඳුළු
තාමත් බිම වැටෙන...
වත්තේ ලොරියෙන්ම
නුඹ ගෙනත් දැමූවත්
මහ ඉස්පිරිතාලෙට
පඩියෙන් කපනවාලු
ඒකත් උන්...
හුස්මක් වැටේදැයි
කඳුළු පිසිනා දෑසක්
එබිකම් කරනවා දුටිමි
සුදු රෙද්දකින් වැසූ මුත්...**


***-දිනූෂ පරණවිතාන-***

## නැතුවම බැරිද ?

ඉර අව්වට පිච්චුනත්
ලෝකයේ කොහේ වුනත්
මිනිස්සු
ඉර එක්ක තරහ නෑ
ඉර නැතුව ඉන්න බෑ...
ගින්දර
කොච්චර
දවා හළු කෙරුවත්
ගින්දරත් උහුලනවා
නැතුව බැරි හින්දා...
කුණාටු, සුළි සුළං
ගංවතුර
නසා වනසා දැම්මත්
වැස්සටත් ආසයි
නැතුව බැරි හින්දා...
අත පය හතර මැද
කඳ බඩ ඉහ මොළ
රඳවන් ඉන්න
පිටින් බැලුවාම
කිසිම වෙනසක්
නොපෙනෙන
මිනිසුන් බෙදන
කපන, කොටන
ගහන, මරණ
ජාති ආගම්
මොනවට රකිනවද මන්දා...?
මොනවට වඳිනවද මන්දා...?
නැතුවම බැරුවද මන්දා...?

*සමන්ත රූපසිංහ*

## දුන්හිඳ



**වහ වැටිලා හිටියෙ මම
බලන්නට උඹේ ලස්සන
හැමදාමත් ආවට
යන්න වෙලා දුර රටකට මට
දමා නුඹ තනිකර
ආයමත් ආ විටක
නොවිකිණි හිටියොත් උඹ
හෝටලයකට
හැකිය මට දැක ගන්න
උඹේ ඔය ලස්සන
දුන්හිඳ....!**

***සඳමාලි එදිරිසිංහ***

# අද රටේ උගත්කම බල්ලාට ගිහිල්ලා

## අපි අපේ වටිනාකම් නැති කරගෙන තියෙන්නේ

*ලෝක විද්‍යා ඇකඩමියේ 2017 වර්ෂයේ තරුණ විද්‍යාඥයාට හිමි සම්මානය හිමිවූයේ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුටය. මොරටුව විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකු වන ඔහු නමින් රංගික හල්වතුරයි. මේ FORWARD ඔහු සමඟ කළ කතා බහ.*



**ඔබ ගැන කෙටි හැඳින්වීමක් කළොත්?**

මම රංගික. මම විශ්වවිද්‍යාලයේ උගන්වන මනුෂ්‍යයෙක්. එහෙම කියන්න මම කැමතියි. විෂය කරුණු ඉගැන්වීමට වඩා ආචාර්යවරයෙක් කිව්වම මම දකින විදියක් තියෙනවා. ආචාර්යවරයෙක් වුනාම ප්‍රධානතම දේ තමයි ඉගැන්වීම. ඉගැන්වීම කියලා මම සඳහන් කරන්නේ, විෂය කරුණුවලට වඩා ජීවිතය ගැන, අපේ වගකීම් ගැන ඉගැන්වීමයි. විෂය කරුණු ගැන කතා කිරීමෙන් එහාට ගිහින් මම පර්යේෂකයෙක් ලෙස කටයුතු කරන කෙනෙක්. ගොඩක් වෙලාවට කණ්ඩායමක් එක්ක පර්යේෂණ කරගෙන යන්න මම ආසයි. මාව සරලව හඳුන්වා දුන්නොත් මම ගුරුවරයෙක් සහ විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක්. ඒ වගේම විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක් කිව්වම පර්යේෂණ හා ඉගැන්වීම් දෙකම තියෙන්න ඕනා. මම හිතන්නේ ඒ දෙකම කරගෙන යන මනුෂ්‍යයෙක් වශයෙන් හැඳින්වූවොත් හොඳයි.

**ඔබට ලැබුණු සම්මානය ගැන රටම කතා වෙනවා. මොකක්ද මේ සම්මානය?**

ඇත්තෙන්ම සම්මාන දෙකක් එකට පටලවාගෙනයි තියෙන්නේ. මට දැනට මාස ගණනකට කලින් Most Outstanding Sri Lankas කියන සම්මානය හිමි වුණා. ඊට පස්සේ ලෝක විද්‍යා ඇකඩමියෙන් "2017 වසරේ තරුණ විද්‍යාඥයා" කියන සම්මානය ලැබුණා. ඒක තමා මට ළඟදිම ලැබුණු සම්මානය.

**ඔබට මේ සම්මානය ලැබුණේ කුමක් වෙනුවෙන්ද?**

අපි පර්යේෂණ කරන අන්ත කිහිපයක් තියෙනවා. අපේ දැනුම එළියට දීලා පුළුවන් තරම් මිනිස්සු දැනුවත් කරනවා. පර්යේෂණ කරලා ඒක බුද්ධිමය දේපළක් බවට පත්කරලා තියාගන්නවා. පර්යේෂණ ගොඩක් කළත් වැඩක් නැහැ, ඒක මිනිස්සු දන්නේ නැත්නම්. ජාතිකව හා ජාත්‍යන්තරව එම පර්යේෂණ, මිනිස්සු කොතරම් දුරට පරිශීලනය කරනවද අගය කරනවද, කියන එක මේ සම්මානය පිරිනැමීමට හේතු වෙනවා. මේ කරුණු සියල්ල සලකා බලා තමයි මේ සම්මානය ලබා දෙන්නේ.

**මීට අමතරව ඔබ විසින් සිදුකළ සොයාගැනීම් රාශියක් තිබෙනවා. ඒ ගැනත් සඳහන් කළොත්?**

නව නිපැයුම් 7කට මට පේටන් අයිතිය තිබෙනවා. ඉන් පේටන් 4ක්ම තියෙන්නේ පස් සම්බන්ධයෙන්

රටේ ප්‍රවෘත්ති ගත්තම වැඩි හරියක් තියෙන්නේ, එක්කො මළගෙයක්, එක්කෝ හොරකමක්, වංචාවක් ගැන. මිනිස්සුන්ට රට ගැන හැඟීමක් ඇතිවෙන ප්‍රවෘත්ති නැහැ.

කළ පර්යේෂණවලට. පස්වලින් හදපු කොන්ක්‍රීට් ගල (mud concrete block) ඉන් විශේෂයි. ඊට අමතරව ගොඩනැගිල්ලක වහල වෙනුවට ස්ලැබ් එකක් දැම්මොත් ඇතුළට රස්නේ එන එක වළක්වන්න කළ සොයාගැනීමට, ස්ලැබ් එක නැවත පාවිච්චියට ගන්න හැකි විදිහට හදපු නිර්මාණයට, උණ බටවලින් ඇතුළට රස්නේ එන එක වළක්වන සිස්ටම් එකට වගේම ස්ලැබ් එක උඩ තණ කොළ වවන සිස්ටම් එකටත් මට පේටන් ලැබුණා. තව පේටන් 9ක් අයදුම් කරලා තියෙනවා.

**පේටන් අයිතිය හිමි වූ ඔබේ මේ නව සොයාගැනීම් රටේ අවශ්‍යතාවය වෙනුවෙන් යොදා ගැනෙනවාද?**

පළමුවෙන්ම කියන්න ඕනා මේ පේටන් මගේම නොවෙයි. උපාධි අපේක්ෂිත ශිෂ්‍යයන්ගේ ඉඳලා අපි කණ්ඩායමක් ලෙස වැඩ කරනවා. අපි පේටන් ගන්න එකේ අරමුණ තමයි, අපේ නිෂ්පාදන අයිතිය තියා ගැනීම. අනිත් එක තමයි. ඒක විකුණලා මුදල් හොයාගන්න එක. මම හිතනවා මම මේ කරපු හැම දෙයක්ම මිනිස්සුන්ගේ සල්ලිවලින් කරපු දේ කියලා. ඒ හින්දා විකුණන්න කලින් මිනිස්සුන්ට ප්‍රයෝජනයක් ඇති වැඩක් කරන්න මට උවමනා වෙලා තියෙනවා. ඒක නිකන්ම අපි ළඟ හංගන් ඉන්න නෙවෙයි. මේ හැම දෙයක්ම ප්‍රසිද්ධියට පත් කරලයි තියෙන්නේ. ඕනෑම කෙනෙකුට අවශ්‍ය දැනුම අරගෙන ප්‍රයෝජනයට ගන්න පුළුවන්. හැබැයි ව්‍යාපාර මට්ටමින් නෙවෙයි.

**ඔබ කියලා තිබුණා වැඩියෙන්ම සතුටු වෙන්නේ දිළිඳු ජනතාවට සේවය කිරීමෙන් කියලා. ඒ ඇයි ?**

ඇත්තටම අද රටේ උගත්කම බල්ලට ගිහිල්ලා. අපි අපේ වටිනාකම් නැති කරගෙන තියෙන්නේ. අපේ මිනිස්සු එක්කෝ දේශපාලඥයෝ පස්සේ යනවා. නැති නම් සල්ලි පස්සේ ගිහිල්ලා විනාශ වෙනවා. ඒ නිසා අධ්‍යාපනයට සහ උගත්කමට රටේ තැනක් දීලා නැහැ. අනික් පැත්තෙන් තමයි රටේ ප්‍රවෘත්ති ගත්තම වැඩි හරියක් තියෙන්නේ, එක්කො මළගෙයක්, එක්කෝ හොරකමක්, වංචාවක් ගැන. මිනිස්සුන්ට රට ගැන හැඟීමක් ඇතිවෙන ප්‍රවෘත්ති නැහැ. ඉතින් මේ වෙලාවේ මේ ගැන මාධ්‍යවලින් පළ කරලා උගත් කමට තැනක් දීපු එක ගැන සතුටු වෙනවා. මට මේ ලැබුණු තිළිණයට වඩා මිනිස්සු වෙනුවෙන් ඇත්තටම දෙයක් කරන්න අවස්ථාව හිමි වුණා. මට උගන්නපු මාව මේ තත්වයට පත් කරපු ඒ මිනිස්සු වෙනුවෙන් යමක් කරන්න ලැබුණු එක ගැන සතුටු වෙනවා.

**ඔබේ ඉදිරි බලාපොරොත්තු ගැන කෙටියෙන් කිව්වොත් ?**

ඉතාම සරලයි. මගේ ජීවිතයේ මගේම කියලා ලොකු බලාපොරොත්තු නැහැ. හැමදාම මම හිතපු දේ කළා. කොහොමහරි මම ඒ දේ ලබා ගත්තා. බැරිවුණු දේවලුත් තිබුණා. මම කියන්නේ නැහැ මට හැමදේම ලැබුණා කියලා. මං මගේ ජීවිතේ හදාගෙන ආවා. ගුරුවරයෙක් ලෙස මට දෙයක් කියන්න පුළුවන්. තමාට වඩා ඉස්සරහට යයි කියලා දැන දැනම උදව් කරන, එහෙම කරන්න පුළුවන් එකම වෘත්තීය ගුරු වෘත්තියයි. මට පුළුවන් නම් මගේ දරුවෝ මට වඩා ඉදිරියෙන් ඉන්නවා දකින්න මට ඊට වඩා සතුටක් නැහැ. ඒ සතුට විඳින්න මම බලාපොරොත්තුවෙන් ඉන්නවා. මට විතරක් ලෝකය වෙනස් කරන්න බැහැ. හැබැයි මට පුළුවන් නම් එක්කෙනෙක් හරි මම හිතන විදිහට වෙනස් කරන්න ඊට වඩා සතුටක් මගේ ජීවිතයේ නැහැ.

---

# බෙදී වෙන් වෙමුද? එක්ව නැගී සිටිමුද?

මාස කිහිපයක සිට නිතර නිතර සංවාදයට ගැනෙන රොහින්ග්‍යා සරණාගත ගැටලුව පිළිබඳව අදහසක් දැක්විය යුතු බව අපගේ හැඟීමයි. මියන්මාරයේ රොහින්ග්‍යා සරණාගතයින් පිරිසක් ලංකාවට පැමිණීම නිසා ව්‍යාජ දේශප්‍රේමීන් කලබල වී තැන් තැන්වල උද්ඝෝෂණ හා මාධ්‍ය සාකච්ඡා පවත්වමින් සිටින අයුරු පසුගිය කාලය පුරාම දක්නට ලැබුණි.

මියන්මාරයේ ජාතිකත්ව අතර විරසකභාවය ඇති වූයේ කෙසේද යන්න සලකා බලනවා වෙනුවට අපි අපේ රටේ අත්දැකීම් සමඟ මෙය තේරුම් ගැනීමට උත්සාහ කරමු. අපේ රටේ වසර 30ක් පුරා පැවති යුද්ධය නිර්මාණය වීමට අවශ්‍ය වස්තු බීජය නිර්මාණය කළේ කවුරුන්ද? උපන් බිමේ ජාතිකත්ව දෙකක් අතර විරසකභාවයක් නිර්මාණය කර මව්බිමේ සියදහස් ගණනක් මිනිස් ජීවිත අහිමි කර තවත් ලක්ෂ ගණනක් උපන් බිමේ සරණාගතයින් බවට පත්විය. එයට වගකිව යුතු පාලකයින්ට එරෙහිව උල්පන්දම් දීම හැර ව්‍යාජ දේශප්‍රේමීන් විසින් අන් යමක් නොකළ බව අපට විශ්වාසයි.

බ්‍රිතාන්‍ය පාලකයින් විසින් අපේ රට, ඔවුන්ගේ යටත් විජිත කොළනියක් ලෙස පවත්වාගෙන යන අවධියේ සිටම වර්තමානයේ පාලන බලය හොබවන පාලකයින් දක්වාම තම බලය පවත්වාගෙන යෑම සඳහා ජාතිකත්ව අතර සතුරුභාවය නිර්මාණය කොට එකිනෙකා ගහමරා ගන්නා තත්වයකට පත් කරනු ලැබීය. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ජාතිකත්ව ස්වීකරණය වී එක් ජාතියක් බිහිකරනවා වෙනුවට ජාතිකත්ව බෙදා වෙන්කර පාලනය කරන ලදී. පසුව බලයට පැමිණි එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද සිංහල, දෙමළ, මුස්ලිම් ජාතිකත්ව අතර ජාතික සමගිය නිර්මාණය කරනවා වෙනුවට ඔවුන් අතර විරසකභාවය වැඩි කරන ලදී. එලෙස තමන්ගේ පැවැත්ම වෙනුවෙන් ජාතිවාදය අවුළුවන ලදී. එහි ප්‍රතිඵලය ලෙස වසර 30ක් තිස්සේ විශාල වශයෙන් මිනිස් ජීවිත ද දේපළ ද රටට අහිමි කරගන්නා ලදී.

වර්තමාන සිදුවීම් නිවැරදිව තේරුම් ගත යුතුව ඇත්තේ ඒ අනුවය. ජාතිකත්ව අතර විරසකභාවය නිර්මාණය කරන සිදුවීම් හුදකලාව ගලා යාමට ඉඩ ලබාදුන්නහොත් නැවත වතාවක් අපම අපේම රටේ සරණාගතයින් බවට පත්විය හැක. එම නිසා සිදුවීමට යන ක්‍රියාවලියේ භයානක ප්‍රතිඵල කල්තියා දැක එය නැවැත්වීමට අවශ්‍යය ක්‍රියාමාර්ග ගැනීම වර්තමාන තරුණ පරපුරේ වගකීමයි.

සිංහල වුවද දෙමළ වුවද මුස්ලිම් වුවද අප එකම මිනිස් වර්ගයක් බව සිහිතබා ගත යුතු වන්නේ එහෙයිනි.

# අධිරාජ්‍ය විරෝධී තාරුණ්‍යයේ බලමුළුව

ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය මඟින් පවත්වනු ලැබූ 19 වන ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල පසුගිය 14 සිට 22 වන දා දක්වා රුසියාවේ සෝචි නගරයේ දී ඉමහත් අභිමානයෙන් යුතුව පැවැත්විණි.

ජ.වි.පෙ. නියෝජනය කරමින් සමාජවාදී තරුණ සංගමය හා සමාජවාදී ශිෂ්‍ය සංගමය මෙම උළෙල සඳහා සහභාගී විය. මෙවර උළෙල සඳහා ලොව පුරා රටවල් 183ක් නියෝජනය කරමින් අධිරාජ්‍ය විරෝධී, ප්‍රගතිශීලී, වාමාංශික තරුණ හා ශිෂ්‍ය සංවිධානවල 24,000කට අධික තරුණ තරුණියන් පිරිසක් සම්බන්ධ වූහ. ''ලෝක සාමය, සහයෝගීතාව සහ සමාජ සාධාරණත්වය සඳහා අධිරාජ්‍යවාදයට එරෙහිව සටන් වදිමු, අතීතයට ගරු කරමින් අනාගතය ගොඩනගමු'' යන්න මෙවර උළෙලේ තේමාවයි.

එසේම මෙවර උළෙල තුළ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ සියවස් සමරුවට අදාළ වැඩසටහන් කිහිපයක්ම යෙදී තිබීමද සුවිශේෂී කාරණයක් විය.

ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ ආසියා පැසිෆික් කලාපය නියෝජනය කරමින් උප සභාපතීත්වය දරණ සමාජවාදී තරුණ සංගමය විසින් මෙවර උළෙල සඳහා දැක්වූ සිය සක්‍රිය දායකත්වය හා මැදිහත්වීම උළෙල හි කාගේත් සුවිශේෂී අවධානයක් දිනාගැනීමට සමත් විය.




උළෙල තුළ සංවිධානය කර තිබූ සම්මන්ත්‍රණ, දේශන හා සාකච්ඡා ආදිය සඳහා මෙන්ම උළෙලට සහභාගී වූ සියලුම රටවල නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්වූ පා ගමනටද එක් වෙමින් වඩාත් අර්ථවත් හා සටන්කාමී මැදිහත්වීමක් සිදුකිරීමට අපට හැකි විය.

කියුබාව, උතුරු කොරියාව, වෙනිසියුලාව හා පලස්තීනය යනාදී රටවලට එරෙහිව සිදුකරන ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී රටවල්වල මැදිහත් වීමට එරෙහිව එම සියලුම රටවල්වලට සහයෝගීත්වය පළකරන වැඩසටහන් සඳහා සහභාගී වෙමින් අපගේ සහයෝගය පළකරමින් අදහස් දැක්වීමත්, එම රටවලට එරෙහිව සිදුකරන අධිරාජ්‍යවාදී මැදිහත්වීම්වලට විරුද්ධව බැනර් අත්සන් කිරීමත් සිදුකළ අතර එය උළෙලේ වැඩසටහන් අතර සුවිශේෂී අවධානයක් දිනාගැනීමටද සමත් විය.

එසේම උළෙලෙහි සුවිශේෂී අංගයක් ලෙස පැවැත්වූ අධිරාජ්‍ය විරෝධී අධිකරණය හමුවේ කරුණු දක්වමින් ශ්‍රී ලංකාව තුළ අධිරාජ්‍යවාදී බහුජාතික සමාගම්වල මැදිහත්වීම මත කෘෂිකර්මාන්තය තුළ සිදුකරන රසායන ද්‍රව්‍ය භාවිතයත් එහිම ප්‍රතිඵලයක් ලෙස රජරට ප්‍රදේශයේ පැතිර යන වකුගඩු රෝගය හා එහි හානිකර තත්වයන් පිළිබඳවත් අවධාරණය කරවීමට හැකිවිය.

ලෝකයේ අධ්‍යාපන පුද්ගලීකරණය, ඊට එරෙහි අරගලය සහ එහි ප්‍රතිවිපාක යන මැයෙන් සංවිධානය කර තිබූ සම්මන්ත්‍රණයේදී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මතුව ඇති අර්බුදය සහ අධ්‍යාපන පුද්ගලීකරණයත් එහිම ප්‍රතිඵලයක් වන සයිටම් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය අහෝසි කිරීම සඳහා සිදුකරන ශිෂ්‍ය අරගලයන් ගැනත් දැනුවත් කිරීමට හැකියාව ලැබුණු අතර සයිටම් ආයතනය අහෝසි කරන ලෙස බලකරනු ලබන බැනරයක්ද සමාජවාදී ශිෂ්‍ය සංගමයේ මැදිහත් වීමෙන් අත්සන් කෙරිණි.

එසේම ''පුද්ගල අයිතිවාසිකම් තහවුරු කිරීමට ධනවාදය අසමත් වී ඇති බව සහ විරැකියාව ඇතුළු තරුණ තරුණියන් මුහුණ දී ඇති ගැටලු යනු එහි ප්‍රතිඵලයකි'' යනුවෙන් පැවැත්වූ සම්මන්ත්‍රණය සඳහා සමාජවාදී තරුණ සංගමය ද දායක වෙමින් අදහස් දැක් වූ අතර ලංකාවේ තරුණ ප්‍රජාව මුහුණ දී ඇති විරැකියාව විවිධ ගැටලු සම්බන්ධයෙන් ද සභාවේ අවධානය යොමු කරවන ලදී. එහිදී සමාජවාදී තරුණ සංගමය විසින් මෙරට තරුණ අයිතීන් දිනාගැනීම සඳහා සිදුකරන අරගලය සම්බන්ධ බැනරයක් ප්‍රදර්ශනය කිරීමටද කටයුතු කරන ලදී.

මීට අමතරව මාධ්‍ය හා තොරතුරු සන්නිවේදනයේ අධිරාජ්‍යවාදී හැසිරීම, ලෝක සරණාගත ගැටලුව අධිරාජ්‍යවාදයේ ප්‍රතිඵලයකි, විෂ මිත්‍රද්‍රව්‍යයට එරෙහි අරගලය, ඒඩ්ස් රෝග යට එරෙහි අරගලය, කියුබානු විප්ලවය සහ ෆිදෙල් කස්ත්‍රෝ, ධනවාදය යටතේ ස්වභාවික සම්පත්වල විනාශය මඟින් ඇති වන සමාජීය බලපෑම්, ධනවාදයේ අර්බුදය සහ තරුණයන්ගේ කාර්යභාරය, රටවල ජාතික විමුක්ති අරගල සඳහා රුසියන් විප්ලවයේ බලපෑම, ලිංගික වෙනස මත අයිතීන් නොලැබීම, ආගමික අන්තවාදය හා ජනවාර්ගික ගැටුම් යනාදී තේමා යටතේ පැවති සම්මන්ත්‍රණ සඳහා ද සහභාගී වෙමින් දේශන හා අදහස් දැක්වීමටද අප කණ්ඩායමට හැකි විය.

මීට අමතරව උළෙලට සම්බන්ධ වූ විදේශීය සහෝදර සංවිධාන සමඟ සාකච්ඡා ගණනාවක් පැවැත්වීමටත් එමඟින් එම රටවල්වල පවතින දේශපාලන තත්වය හා තරුණ, ශිෂ්‍ය ව්‍යාපාරයන් සිදුකරන අරගල පිළිබඳවත් එම අරගලවලදී ඔවුන් ලද අත්දැකීම් පිළිබඳවත් අදහස් හුවමාරු කරගැනීමටත් හැකි විය. සමස්ත උළෙල පුරාම සෑම නියෝජිතයෙකු තුළම අධිරාජ්‍යවාදයට එරෙහි අරගලය පිළිබඳව උත්තේජනයක් ඇතිකිරීමට සමත්ව තිබුණි. එසේම ලෝක පරිමාණයෙන් අධිරාජ්‍යවාදයට හා ධනවාදයට එරෙහිව සිදුකරන අරගලයට නව ප්‍රාණයක් එක් කිරීමට හැකියාව ලැබුණු අතර මෙම සියලු අර්බුදයන්ට විසඳුම ඇත්තේ අසාධාරණ ධනවාදී සමාජක්‍රමය බිඳ වට්ටවා සිදුකරන සමාජවාදී සමාජ විප්ලවය තුළ පමණක්ය යන්න සියලුදෙනාගේම හදවත් තුළ ගැඹුරු ලෙස තහවුරු විය.

# ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ වෙනිසියුලානු පාඩම



සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නව පාඩමක් ලොවට කියාදීමට වෙනිසියුලාව සමත් වී ඇත. ඒ අනුව එරට යථාතත්වයට පත්වීමේ හැකියාව සහ ධෛර්යයසම්පන්නභාවය පෙන්නුම් කර ඇති බවද විදෙස් මාධ්‍ය වාර්තා කරයි.

ඇමරිකා එක්සත් ජනපදය විසින් එල්ල කරමින් ඇති දරුණු ප්‍රහාර හමුවේත් ඇමරිකන් ආධාර සහ අනුග්‍රහය ලබමින් ක්‍රියාත්මක වූ විරුද්ධ පක්ෂයේ ප්‍රචණ්ඩ උද්ඝෝෂණ හා මාධ්‍ය ප්‍රචාරණ හමුවේත් ''මඩුරෝ පාලනය'' බිඳවැට්ටවීමේ ඔවුන්ගේ තැත ව්‍යර්ථ වී ඇත.

දේශපාලන විද්‍යාවත්, දේශපාලන යථාර්ථයත් පිළිබඳව දැනුවත් ජනතාව අතරින් වෙනිසියුලානුවන්ද ඉදිරියෙන්ම සිටින බවත් පැමිණි දුෂ්කරතා කවුරුන් විසින් ඇති කරන ලද්දක් දැයි ඔවුන් තේරුම්ගෙන ඇති බවත් මෙවර පළාත් පාලන ඡන්ද ප්‍රතිඵලයෙන් පෙනී යන බව විදෙස් මාධ්‍ය වාර්තාවලින් අනාවරණය වේ.

ඒ පසුගියදා ජාතික ව්‍යවස්ථා සභාව පිහිටුවා ගැනීම සඳහා පැවැති මැතිවරණයේදී විරුද්ධ පක්ෂයේ කඩාකප්පල්කාරී සහ ප්‍රචණ්ඩ ප්‍රයත්නයන් මැද පවා තම බිම්මට්ටමේ නියෝජිතයින් තෝරා පත්කර ගැනීම සඳහා එහි ජනතාව කටයුතු කිරීම නිසාවෙනි. එසේම එයින් නතර නොවී මෑතකදී පැවැත්වූ පළාත් පාලන මැතිවරණයේද ප්‍රදේශ 17ක බලය මඩුරෝ පාලනයට ලබාදීමත් විරුද්ධ පක්ෂයේ ජය ප්‍රදේශ 5කට සීමා කරවීමත් සුවිශේෂිය.

# දකුණු කොරියා - ඇමරිකා යුධ සැලසුම් උතුරු කොරියාව අතට



උතුරු කොරියානු නායක කිම් ජොන් අන් ඝාතනය කරනු ලැබීමේ සැලැස්මක් ද ඇතුළුව දකුණු කොරියානු ආණ්ඩුවේ යුධ ලේඛන තොගයක් උතුරු කොරියාව අතට පත්ව ඇති බවක් වාර්තා වෙයි.

එම තොරතුරු සිය රටේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබාගෙන ඇති බව දකුණු කොරියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මෙන්ම ආරක්ෂාව පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ සාමාජිකයෙකුද වන ලී චල් හී සඳහන් කරයි.

දකුණු කොරියාවේ ආරක්ෂක අමාත්‍යාංශයේ පරිගණක ජාලයට ඇතුළු වීමෙන් (හැක් කර) මෙම ලේඛන ලබාගෙන ඇති බව දැනට ඇති තොරතුරු අනුව වාර්තා වේ.

අනාගතයේ සිදුවීමට ඉඩකඩ ඇති යුද්ධයක් සැලකිල්ලට ගනිමින් ඇ.එ. ජනපදය සහ දකුණු කොරියාව අතර ඇති වූ එකඟතාවක් අනුව පිළියෙල කළ යුද සැලැස්මක්ද දෙරටේ ජ්‍යෙෂ්ඨ අණදෙන නිලධාරීන්ට යොමු කෙරෙන වාර්තාද මෙසේ පැහැරගැනීමට ලක්ව ඇති ලේඛන අතර ඇතැයි වැඩිදුරටත් සඳහන්ය.

එසේම දකුණු කොරියාවේ යුද මධ්‍යස්ථාන සහ විශේෂ විදුලිබල මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු හා එරට විශේෂ හමුදාවන්ට අදාළ සැලසුම් ද උතුරු කොරියාව අතට පත්ව ඇති බවද දැනගන්නට ඇත.

# කුර්දිස්ථානයට පක්ෂව ඡන්දය 92%ක්



උතුරු ඉරාකයේ කුර්දි කලාපය නිදහස් රාජ්‍යයක් බවට පත්විය යුතු බව පසුගිය දා පැවැත්වුණු ජනමත විචාරණයේ දී කුර්දි ජාතිකයන් සහ කුර්දි ජාතිකයන් නොවන වැසියන් ගෙන් 92%කගේ මතය වී තිබේ.

මෙම ජනමත විචාරණය විශාල මතභේදයකට තුඩු දුන් අතර එය අවලංගු කරන ලෙසත් තම පාර්ශවය සමඟ සාකච්ඡා කරන ලෙසත් ඉරාකයේ අගමැති හයිදර් අල් අබඩි විසින් අවසන් මොහොතේ පවා ඉල්ලීමක් කර තිබුණි.

එසේම ඛනිජ තෙල්වලින් පොහොසත් කිර්කුක් නගරය සහ මතභේදයට තුඩු දී තිබෙන අනෙක් පළාත්වල හමුදාව රඳවන මෙන් ඉරාක පාර්ලිමේන්තුව අගමැතිවරයාගෙන් ඉල්ලීමක්කර තිබේ.

කෙසේ නමුත් කුර්දි නායකයන් පවසන්නේ වෙනම රාජ්‍යයක් පිහිටුවීම පිළිබඳව ඉරාක සහ අසල්වැසි රටවල නායකයන් සමඟ සාකච්ඡා පැවැත්වීම පිණිස තමන්ට ජනවරමක් ලැබී තිබෙන බවය.

# කාන්තාවන්ට අනතුරුදායකම නගරය කයිරෝ



කාන්තාවන්ට අනතුරුදායකම මෙගා නගරය ඊජිප්තුවේ කයිරෝ අගනුවර යයි ජාත්‍යන්තර සමීක්ෂණයකින් අනාවරණය වී ඇත.

සමීක්ෂණය සිදුකර ඇත්තේ කාන්තා අයිතීන් වෙනුවෙන් පෙනීසිටින ජගත් සංවිධානවල එකමුතුවෙනි. මෙවැනි සමීක්ෂණයක් පැවැත්වුණු පළමු අවස්ථාව මෙය වෙයි.

ලොව ප්‍රධාන පෙළේ මෙගා නගර සම්බන්ධයෙන් මෙම සමීක්ෂණය සිදුකර ඇතැයි විදෙස් පුවත් සේවා පෙන්වා දෙයි. මෙගා නගර යනුවෙන් හැඳින්වෙන්නේ මිලියන 10කට වැඩි පිරිසක් ජීවත් වන නගරය.

ඒ අනුව සිදුකළ සමීක්ෂණයට අනුව, කාන්තාවන්ට නිසි ආරක්ෂාවක් නැති ඔවුන්ව ලිංගික හිංසනයට ගොදුරු වන ලොව අංක එකේ නගරය ලෙස ඉහළින්ම ඇත්තේ කයිරෝ නගරයයි.

## දැනුම 02

*විශ්වයේ බිහිවීම පිළිබඳ විද්‍යාත්මක කියවීමක් ලෙස පසුගිය මාසයේ FORDARD තුළින් ඉදිරිපත් කළ ලිපියේ දෙවන කොටස ලෙස මෙම ලිපිය ඔබට ඉදිරිපත් කරන්නෙමු. අප මුල් කොටසින් සාකච්ඡා කළේ විශ්වය යනු කුමක්ද යන්නත්, චක්‍රාවාට, තාරකා, සුපර්නෝවා ආදියත් පිළිබඳවය. විශ්වයේ බිහිවීම පිළිබඳ විවිධ මතවාද හා තවත් තොරතුරු සාකච්ඡා කිරීමට මෙවර අපි අපේක්ෂා කරන්නෙමු.*

# මහා පිපුරුම් වාදය

## Big Bang Theory



විශ්වය බිහිවීම සම්බන්ධයෙන් විවිධ මතවාදයන් සමාජය තුළ දැකගත හැකිය. ඒ අතුරින් වර්තමානය වන විට වඩාත් පිළිගැනීමට ලක්වූ මතවාදය වන්නේ මහා පිපුරුම් වාදයයි. නැතිනම් Big Bang Theory එකයි. විශේෂයෙන් 20 වන ශතවර්ෂයේ මුල් භාගය වන තුරුම තාරකා විද්‍යාඥයින් විසින් දැරූ මතය වූයේ විශ්වය ස්ථිර වශයෙන්ම සදාකාලික බවයි. මහා පිපුරුම් වාදය නම් සංකල්පය මුලින්ම ඉදිරිපත් කරන ලද්දේ "ජොර්ජ් ගැමොව්" (George Gamow) නම් රුසියානු ජාතික විද්‍යාඥයා විසිනි. පසුව "ජෝර්ජ්ස් ලැමෙත්‍රා" Georges Lemaître නම් ප්‍රංශ ජාතික විද්‍යාඥයා විසින් එම මතය විස්තාරණය කරන ලදී.

මොවුන් විශ්වය පිළිබඳ ප්‍රකාශ කළේ මෙවන් අදහසකි. "ඈත අතීතයේ දී විශ්වයේ සියලු කොටස් එක්තැන්ව තිබිණි. එම කුඩා එකතුව තුළ සිදුවූ මහා පිපිරීමකින් විශ්වයේ සියලු කොටස් විසිරී ගියේය. විසිරී ගිය කොටස්වලින් චක්‍රාවාට නිර්මාණය වී මූලද්‍රව්‍ය පහළ විය."

ඉන් පසුව 1917 ඇල්බට් අයින්ස්ටයින් (Albert Einstein) ඉදිරිපත් කළ සාපේක්ෂතාවාදය ඔස්සේ පර්යේෂණ මෙහෙයවූ රුසියානු ජාතික ලෙක්සැන්ඩර් ෆ්‍රීඩ්මාන් විසින් විශ්වයේ ඇති චක්‍රාවාට එකිනෙකින් ඈත් වෙමින් පවතින බව ප්‍රකාශ කරන ලදී. ඇමරිකන් ජාතික තාරකා විද්‍යාඥ එඩ්වින් හබල් (Edwin Hubble) හා මිල්ටන් හියුමෙෂන් (Milton Humason) යන දෙදෙනා 1929 දී ඒ අදහස වඩාත් පැහැදිලි කොට තහවුරු කළහ. වර්ෂ 1929 දී එඩ්වින් හබල් විසින් "හබල් දුරේක්ෂය" සොයාගැනීමත් සමඟ චක්‍රාවාට එකතැන පවතින්නේ නැති බවත් ඒවා ඉතා වේගයෙන් ප්‍රසාරණය වන බවත් සොයාගනු ලැබීය. චක්‍රාවාට යනු තාරකා බිලියන ගණනාවකින් සමන්විත පොදියක් යැයි කිව හැකිය. විශ්වයේ පවතින චක්‍රාවාට අතර ඇති පරතරය කෙමෙන් කෙමෙන් වැඩි වෙමින් යන බව තේරුම්ගත හැක්කේ මුල සිටම විශ්වය ප්‍රසාරණය වෙමින් පවතින බැවිනි. එමෙන්ම ඈතින් පිහිටා ඇති චක්‍රාවාට ඉතා වේගයෙන් ප්‍රසාරණය වන අතර ළඟින් පිහිටි චක්‍රාවාට ප්‍රසාරණය වන වේගය අඩු බවත් ඔහු ප්‍රකාශ කළේය.

Big Bang න්‍යාය තහවුරු කිරීමට හමුවූ පළමු සාක්ෂිය වූයේ හබල් දුරේක්ෂය මඟින් සිදුකළ නිරීක්ෂණයයි. එම නිසා විශ්වය ප්‍රසාරණය වනවා නම් එය ප්‍රසාරණය වීම ආරම්භ වූ ස්ථානය පිළිබඳව ඔවුන් සොයා බැලූහ. ඒ අනුව ඔවුන් සොයාගනු ලැබුවේ, අද පවතින මුළුමහත් විශ්වයම ඉතා කුඩා ලක්ෂයක් තරම් ප්‍රමාණයට, එනම් පරමාණුවකටත් වඩා කුඩාවට පැවති බවයි. තවද අද වන විට විශ්වය පුරා විසිර පවතින මේ බිලියන ගණනක් වන චක්‍රාවාට හා අනෙකුත් දේවල් පැවතුණේ මේ කුඩා ලක්ෂය තුළ බවයි. කාලය ඔස්සේ ආපස්සට ගමන් කිරීමට හැකි නම් මේ galaxy සියල්ලම කෙමෙන් කෙමෙන් එකිනෙකට ළං වී නැති නම්, සංකෝචනය වී අවසානයේ වැලි කැටයකටත් වඩා කුඩාවට එක් වන හැටි අපට දැක ගන්නට හැකි වේවි.

මෙම කුඩා ලක්ෂය ගැන කියනවා නම් එය අනන්ත වූ ඝනත්වයකින් හා අනන්ත වූ උෂ්ණත්වයකින් මෙන්ම සහ අධික ප්‍රචණ්ඩත්වයකින් යුතුවූ ලක්ෂයක් ලෙස පැවතී ඇත. මේ තත්වයේ පවතින ස්ථායිකත්වය සමඟ එක දිගටම මේ ඝනත්වයේම පැවතිය නොහැකි වූ අතර එම නිසා මෙම වස්තුව අධික ප්‍රචණ්ඩත්වයකින් පැවතුණි. එය අධික වේගයකින් පුපුරා ගියේය. මෙම ප්‍රසාරණය කොතරම් ප්‍රබලද කිවහොත් ප්‍රසාරණයේ වේගය සිදුවූයේ ආලෝකයේ වේගයටත් වඩා වැඩි වේගයකින්ය. එය හැම දිශාවකටම ප්‍රසාරණය විය. මෙම පිපිරීම Big Bang නමින් හඳුන්වයි. මෙය සිදුවන්නේ එම ලක්ෂය තුළ ප්‍රමාණාත්මකව සිදුවූ වෙනස්කම් ගුණාත්මක පරිවර්තනයකට ලක්වීම නිසාය.

කාලය, අවකාශය, පදාර්ථ ආදී සියල්ල ඒ මහා පිපුරුම සිදු වනවා සමඟම බිහිවූ දේවල්ය. එමෙන්ම මෙම පිපුරුම සමඟම ගුරුත්වාකර්ෂණය බිහිවූ අතර එය කොතරම් වැදගත් ද කිවහොත් මේ විශ්වයේ ප්‍රමාණය, ව්‍යුහය සහ විශ්වය තුළ දැන් මේ පවතින සෑම සාධකයකටම බලපෑවේ එම මොහොතේ ඇති වූ එකී ගුරුත්වාකර්ෂණ බලයයි. මුල් අවස්ථාවේ දී විශ්වය ප්‍රසාරණය සිදුවූයේ අධික වේගයෙන් සහ ඉතා කුඩා කාල සීමාවක් තුළදීය.

එය තත්පරයකින් මිලියනයකින් පංගුවකදී විශ්වය, ගොල්ෆ් ගෝලයක සිට අපේ පෘථිවිය තරම් ප්‍රසාරණය වුණු අතර මෙහි වේගය ආලෝකයේ වේගයට (තත්පරයට මීටර් 299792458) වඩා වැඩි විය.

මේ වේගය හා පැවති අධික ශක්තිය නිසාම මෙම පිපිරීම අධික ලෙස ප්‍රචණ්ඩ වූවක් විය. එය කොතරම්ද පැවසුවහොත් විශ්වයේ උෂ්ණත්වය මේ වන විට සෙල්සියස් අංශක ට්‍රිලියන 10000 ඒවා ට්‍රිලියනයක් විය. එය සිතා ගැනීමටත් නොහැකි අධික උෂ්ණත්වයකි. එසේම ඒ වන විට විශ්වයේ ඝනත්වය ජලයේ ඝනත්වය මෙන් 1.078 ගුණයකි. ඊළඟ තප්පරයකින් අංශු මාත්‍රයක දී විශ්වයේ ප්‍රමාණය 1050 ගුණයක් විය. එනම් විශ්වය ගැලැක්සියක් තරමට ප්‍රමාණයෙන් වැඩීය. ගැලැක්සි එකිනෙකින් ඈත් වන වේගය අනුව ඒවා එකට එක්ව පැවතුණේ කෙතරම් කලකට ඉහතදී දැයි ගණනය කළ හැකිය. ඒ අනුව විශ්වයේ වයස අවුරුදු බිලියන 13.8 කි. CERN ආයතනයේ Alice උපකරණ භාවිතා කරන පර්යේෂක කණ්ඩායමක් පෙන්වා දෙන්නේ විශ්වයේ මුල්ම අවධියේදී එය ඝනත්වය සහ උෂ්ණත්වයෙන් ඉතා වැඩි ද්‍රවයක් ලෙස පැවතුන බවයි.

(හැකි උපරිම ශක්තියෙන් යම් න්‍යෂ්ටි ත්වරණයකට ලක් කර එකිනෙක ගැටීමට සැලැස්වීමෙන් Alice උපකරණය තුළ දැඩි උෂ්ණත්වය සහ ඝනත්වයෙන් යුත් උප පරමාණුක අංශු සෑදීමට හැකි විය. මෙම අවස්ථාව විශ්වය බිහිවීමෙන් පසුව ප්‍රථම තප්පර කිහිපයට සමාන විය. මෙම පුංචි "මහා පිපුරුම" සිදුවීමේදී අංශක ට්‍රිලියන 10 ට අධික උෂ්ණත්වයක් ජනනය වූ බව විද්‍යාඥයින් පවසයි.)

මෙවන් උෂ්ණත්වයකදී සාමාන්‍ය පදාර්ථ නම් උණු වී සූපයක් නිර්මාණය වේ. මෙය ක්වාක්ග්ලූවොන් ප්ලාස්මා නම් වේ. මීට පෙර ඇමරිකාවේදී මෙයටත් වඩා අඩු ශක්ති යටතේ කළ පර්යේෂණවලදී පෙන්වා දුන්නේ මෙලෙස නිර්මාණය වන අංශු ද්‍රව ලෙස ක්‍රියාකරන බවයි. නමුත් බොහෝදෙනා අපේක්ෂා කළේ ක්වාක්ග්ලූවොන් ප්ලාස්මාව වායුවක් ලෙස ක්‍රියා කරනු ඇත කියායි.

මේ අනුව බලන කල මහා පිපුරුමෙන් පසුව විශ්වය ද්‍රවයක් ලෙස පැවතුන බව පැහැදිලිය. මේ අතර විද්‍යාඥයින් නිරීක්ෂණය කළ අනෙක් දේ නම් මීට පෙර භෞතික විද්‍යා ආකෘතිවල පෙන්වා දුන්නාට වඩා වැඩි පරමාණුක අංශු ප්‍රමාණයක් එහිදී නිෂ්පාදනය වීමයි.

මහා පිපිරීම සිදුවී ගතවූ පළමු තත්පරය තුළදී ශක්තිය මගින් අංශ මෙන්ම ප්‍රති අංශු බිහිවීම ද සිදුවිය. එහෙත් එසේ බිහිවූ අංශු හා ප්‍රති අංශු එකිනෙකා හා ගැටුණු සැණින් ඒ දෙවර්ගයම එකිනෙකා විනාශ කරගත්තේය. එහෙත් මෙහිදී අංශුවලට තරමක් වාසියක් සැලසුණේ සෑම අංශු හා ප්‍රති අංශු කුට්ටම් බිලියනයකටම, එක අමතර අංශුවක් බිහිවීමයි. මෙසේ බිහි වූ අමතර අංශු නොනැසී බේරුණෝය. මෙසේ නොනැසී බේරුණු අංශූ නොවන්නට බිහි වී තත්පරයක්වත් ගත වෙන්නටත් පෙරාතුරුවම පදාර්ථ විශ්වය නිමාවට පත්ව යාමට ඉඩ තිබුණි. අප අද දක්නා සමස්ත පදාර්ථ විශ්වයම ඇති වූයේ එසේ නොනැසී බේරුණු අංශුවලිනි. මේ අංශූ විශ්වය පවතින තුරු පවතීවි. ඒ අනුව විශ්වයේ ඇති පදාර්ථ ප්‍රමාණය සදාකාලිකවම එක සමානය.

මහා පිපුරුම් වාදයෙන් ප්‍රකට වන කරුණු ලෙස විශ්වයේ අද පවත්නා මූලද්‍රව්‍යයන්ගේ උපත සිදු වූ අයුරු විශ්වය පුරා පැතිරී ඇති ක්ෂුද්‍ර තරංගවල පසුබිම් විකරණය සිදුවන ආකාරය මඟින් දැන ගැනීමට හැකියාව ලැබුණි.

වමට

# පියනගමු අලුත් ලොවක් වෙත



වානරයාගෙන් මිනිසා පරිණාමය වූ අවධියේ සිට මේ දක්වා මානව ශිෂ්ටාචාරයේ විවිධ සමාජ ක්‍රම පසුකර දැනට සිටින මෙම සමාජ ක්‍රමය දක්වා මානවයා ගමන් කර ඇත. එනම් වානරයාගෙන් මිනිසා පරිණාමය වූ මුල් සමාජ ක්‍රමය වන ප්‍රාථමික සාමූහික සමාජ ක්‍රමයත්, ඉන්පසු උදා වූ සමාජ ක්‍රමය වන වහල්හිමි සමාජ ක්‍රමයත් ඉන් අනතුරුව වැඩවසම් සමාජ ක්‍රමයත්, පසුකර අප දැනට ජීවත් වන මෙම සමාජ ක්‍රමයට මීට වසර 500කට පෙර පිවිසි අතර එය ධනවාදී සමාජ ක්‍රමය ලෙස හඳුන්වයි. මේ අප ජීවත් වනුයේ මානව සමාජය ගමන් කළ යුතු ඉහළම සමාජ ක්‍රමය තුළ නොවේ. සමාජ විද්‍යාඥයන් විසින් හඳුන්වනු ලබන ආකාරයට ඉහළම සමාජ ක්‍රමය වනුයේ කොමියුනිස්ට් සමාජ ක්‍රමයයි. එක් සමාජ ක්‍රමයක සිට තවත් සමාජ ක්‍රමයකට මානව සමාජය ගමන් කළ යුතුය. ධනවාදයේ සිට ඉහළ සමාජ ක්‍රමය වන කොමියුනිස්ට් ක්‍රමය දක්වා යන සංක්‍රමණික අවධිය සමාජවාදය ලෙස හඳුන්වනු ලැබේ.

## සමාජවාදය යනු කුමක්ද?

සමාජවාදය යනු දැනට පවතින සමාජ ක්‍රමයට මුළුමනින්ම වෙනස් එකකි. දැනට පවතින සමාජ ක්‍රමය තුළ රටේ සම්පත් සුළුතරයක් අත ගොඩගැසෙන අතර සමාජවාදයේ දී නිෂ්පාදනයේ ඵල සියලු දෙනා අතර සාධාරණව බෙදී යනු ඇත. ධනවාදය දේපළ හිමි සුළු පිරිසක් වෙනුවෙන් පවතින්නක් වන අතර සමාජවාදය රටේ වැඩකරන බහුතරයක් ජනතාවගේ උවමනාව වෙනුවෙන් ක්‍රියා කරයි. ධනවාදී පාලනය අධිරාජ්‍යවාදීන්ට රටේ සම්පත් විකුණන අතර, සමාජවාදය රටේ සම්පත් යොදාගනිමින් නිෂ්පාදනය දියුණු කරයි. ධනවාදය ජනතාවගේ භාෂාව, ආගම, ජාතිය, කුලය, අනුව බෙදීමකට ලක් කර පාලනය කරන අතර, සමාජවාදය ජනතාව සමගි කිරීමේ අරමුණු ඇතිව පාලනය කරයි.

එනම් මෙම ධනවාදය විසින් මානව සංහතිය මේ දක්වා ගෙන ගොස් ඇති අවිධිමත් සමාජ ක්‍රමය ගැන අප විසින් වටහා ගත යුතුව ඇත.

■ ලෝකයේ වැඩිම ආදායම් ලබන සමාගම් 03 හි ආදායම ලෝකයේ හරි අඩක් (50%) රටවල ජාතික ආදායමට සමානය.

■ ලෝකයේ හරි අඩකගේ වත්කම්වල එකතුව ලොව මේ වන විට සිටින ඉහළම ආදායම් ලබන පුද්ගලයින් 08 දෙනාගේ ආදායමට සමානය. (ඇති නැති පරතරය තව තවත් වැඩි වෙමින් පවතී.)

■ මෙතරම් දියුණු යැයි උදම් අනන ධනවාදී ලෝකයේ සාක්ෂරතාවයෙන් තොර ජනගහනය කෝටි 100 ඉක්මවයි.

■ පිරිසිදු පානීය ජලය නොමැති ජනගහනය කෝටි 100 ඉක්මවයි.

■ ලෝකයේ සිටින ළමා ශ්‍රමිකයින්ගේ ගණන මිලියන 168 කි.

■ අපරාධ හා ප්‍රචණ්ඩ ක්‍රියා නිසා දිනකට මිය යන සංඛ්‍යාව 3836 කි.

■ ලොව වෙසෙන එච්. අයි. වී. ආසාදිත පුද්ගලයින් සංඛ්‍යාව ලක්ෂ 367 ඉක්මවයි.

■ පාසල් යා යුතු වයසේ පසුවන ළමයින්ගෙන් මිලියන 67.5කට පාසල් යාමට නොහැකි වී ඇත.

## අසමත් ධනවාදය වෙනුවට සමාජවාදය

■ කාන්තා විමුක්තිය ගැන කතා කිරීමේදී ධනවාදය තුළ කාන්තාව ගෘහස්ත වහල්භාවයෙන් ජීවත් වන අතර සමාජවාදය විසින් කාන්තාව ගෘහස්ථ වහල්භාවයෙන් මුදාගනී.

■ ධනවාදය විසින් සියල්ලෙහි මිල පමණක් දන්නා, වටිනාකම නොදන්නා මිනිසුන් බිහි කරන අතර, සමාජවාදය විසින් සියල්ලෙහි වටිනාකම දන්නා මිනිසුන් බිහි කරයි.

■ ධනවාදය විසින් මිනිසුන්ගේ අවශ්‍යතා හා වුවමනා, ලෙඩ රෝග හා ස්වාභාවික විපත් ආදිය ධනය උපදවන මූලයන් බවට පත් කරගෙන ඇත. එහෙත් සමාජවාදය ලෙඩරෝග සඳහා සුවතාවයත්, ස්වාභාවික විපත්වලින් ජනතාව මුදාගැනීමත්, මිනිස් වුවමනා හා අවශ්‍යතා සඳහා නිෂ්පාදනයේ ඵල සියලු දෙනා අතර බෙදී යාමටත් සලස්වයි.

■ සමාජවාදී ආර්ථිකය යනු අයාලයේ දිව යන්නක් නොව, නිශ්චිත සැලැස්මක මධ්‍යගත මෙහෙයුමක් සේ ක්‍රියාත්මක වන්නකි. එපමණක් නොව එය තම සමබරතාවය ඉතා සැලකිල්ලෙන් රැකගන්නා අර්ථ ක්‍රමයකි. එනිසාම ආර්ථිකයේ මෙහෙයුම අතින් එය ධනවාදයට හාත්පසින් වෙනස් ක්‍රියාන්විතයකි. ධනවාදී ආර්ථිකය මෙහෙයවන්නේ තරඟය මතය. වෙළඳපොළ නම් ආර්ථික තරඟ බිම මත මෙම ආර්ථිකය තම අරමුණු සපුරා ගනු ලබයි. ලාභය පසුපස, ආර්ථිකයේ අහඹු ඔස්සේ ලුහුබැඳීම එහි ක්‍රියාන්විතයයි. එහෙත් සමාජවාදය තුළ වෙළඳපොළ යනු ජනතාවගේ පරිභෝජන අවශ්‍යතා ප්‍රකාශනය කරනු ලබන තොරතුරු මධ්‍යස්ථානයකි. ලාභය වෙනුවට අවශ්‍යතාවය ප්‍රමුඛ වූ ස්ථානයකි. එය තරඟයට, අරාජිකත්වයට දොර විවර කරනවා වෙනුවට සැලසුම් කරන ලද මධ්‍යගත මෙහෙයුමකට යටත් එකකි.

■ ධනවාදය මෙන් නොව සමාජවාදය, පංති ආරක්ෂා කිරීමක් නොකරන අතර, එහිදී පංති අහෝසි කිරීමක් සිදුකරනු ලබයි. සියලු සමාජ විෂමතාවන් අහෝසි කරන අතර යළි විෂමතාවය ඇතිවීම වළකාලයි.

■ සමාජවාදී කළමනාකරණය යනු අදාළ ව්‍යවසායේ ද්‍රව්‍යමය සම්පත්, මූල්‍ය සම්පත් හා ශ්‍රම සම්පත් වඩාත් බුද්ධිමත් ලෙස යොදාගැනීම හා වඩා ඵලදායි ලෙස පවත්වාගෙන යාමයි.

## සමාජවාදය කෙරෙහි පවතින මිත්‍යා මත

■ සමාජවාදය තුළ දේපළ පවරා ගන්නා බව පැවසීම.

මෙය සත්‍ය විකෘති කිරීමකි. මිනිසුන් හරිහම්බ කරගත් දේපළ, ගෙවල්, වාහන, ඉඩම් පවරා ගැනීම සමාජවාදය නොවේ. එහෙත් රටේ පොදු ජනතාවගේ දේපළ ලෙස තිබී ධනපති ආණ්ඩු විසින් විකුණා දැමූ දේපළ නැවත ලබාගැනීම සමාජවාදය තුළ ඇතුළත්ය. සමාජවාදය දේපළ පවරා ගන්නේ නැත. සියලුදෙනා මහන්සි වී උපයන ධනය කිහිපදෙනෙක් අතට යන ක්‍රමය වෙනුවට එහි ප්‍රතිඵල, වැඩකරන ජනතාවට ලැබෙන ක්‍රමයක් සකස් කිරීම සමාජවාදයයි. රොබින් හුඩ් හෝ සරදියෙල් පන්නයේ ක්‍රම සමාජවාදයේ නොමැත.

■ සමාජවාදය තුළ පෝළිම් ඇති වීම

සමාජවාදය තුළ සමූපකාර ඇති වී, භාණ්ඩ හිඟ වී, පෝළිම් ඇතිවේ යයි පැවසීම සත්‍යයෙන් තොර ප්‍රකාශයකි. සමගි පෙරමුණු ආණ්ඩුව 1970-1977 කාලයේ සමාජවාදය නමින් කළ බොරුව නිසා මෙවැනි කතා සමාජගත වී ඇත. සමූපකාර ක්‍රමය ඉතා හොඳ ක්‍රමයකි. එය දූෂණයෙන් පිරුණු භාණ්ඩ හිඟ සමූපකාර සමඟ පටලවා ගත යුතු නැත.

■ සමාජවාදය තුළ සියල්ලන් සමාන කරන හා සමානව සම්පත් බෙදාදෙන බව පැවසීම

මෙයද වැරදි මතයකි. මිනිසුන් තුළ උපතේ සිටම විවිධ අවශ්‍යතා පවතී. රුචිඅරුචිකම් වෙනස්ය. අවශ්‍යතා වෙනස්ය. ඒ නිසා සැමදෙනාම සමාන කළ නොහැක. කළ යුත්තේ සියලු දෙනාගේ වෙනස්කම් තේරුම්ගෙන විවිධ හැකියාවන්ගෙන් සමාජයට සේවය ගැනීමක්ය. විවිධ අවශ්‍යතා ඇති අයට එම අවශ්‍යතා සැපයීමක්ය. එහෙත් සමාජවාදයේ දී අයිතිවාසිකම් ලැබෙන විට ඒවා සමානතා පදනමට ලබා දිය යුතුය. අහෝසි කළ යුත්තේ මිනිසුන් අතර වන දුප්පත් පොහොසත්කමේ සීමාය.

■ සමාජවාදය තාරුණ්‍යයට නොගැළපෙන බව

සමාජවාදය යනු නිරන්තරයෙන්ම දැනට පවතින ක්‍රමයට වඩා දියුණු විද්‍යාත්මක සමාජ ක්‍රමයකි. මෙහිදී විද්‍යාව, තාක්ෂණය නිරන්තරයෙන්ම භාවිතා වේ. එනම් තාක්ෂණයේ හා විද්‍යාවේ දියුණුව මානව සමාජයේ හිතසුව පිණිස භාවිතා වේ. තාරුණ්‍යය මිත්‍යාවෙන් ගලවා ගැනීම සඳහා සමාජවාදය විසින් නවීන විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කරගනී. ආහාර, ඇඳුම්, ප්‍රවාහනය ජීවන තත්වය උසස් හා පහසු කරන උපකරණ, සමාජවාදය තුළ නිරන්තරයෙන් භාවිතා වේ. තාරුණ්‍යය විනාශ කරන විෂ මත්ද්‍රව්‍ය, මානව හරපද්ධතීන් බිඳ දමන සංස්කෘතික කාරණා, අධිපරිභෝජනය, වැනි මානව සමාජයට අහිතකර උවදුරුවලින් තාරුණ්‍යය මුදාගත හැක්කේ සමාජවාදයට පමණයි.

■ සමාජවාදය ස්ථාපිත කළ නොහැක්කක් බව

සෝවියට් දේශය කඩාවැටුන ද ඇත්ත මෙය නොවේ. ලෝකයේ අප වැනි රටවල් දුක් විඳිද්දී, ඇමරිකාව ආසන්නයේ සිටිමින් සමාජවාදී කියුබාව තම ජනතාවට වඩා යහපත් ජීවන තත්වයක් ලබාදී ඇත. චීනය ශක්තිමත් වී ඇත්තේ සමාජවාදය නිසාය. අසාර්ථක බව ඔප්පු කර ඇත්තේ ධනවාදයයි. සමාජවාදී සමයේ සෝවියට් දේශයේ තිබූ අයිතිවාසිකම් හා ජයග්‍රහණ එය බිඳවැටුන පසු එහි ජනතාවට නොලැබුණි. සෝවියට් සමයේදී සෝවියට් වැසියන්ට පමණක් නොව, ලොව දුප්පත් රටවල කර්මාන්ත, නිවාස, මංමාවත්, සෞඛ්‍ය, අධ්‍යාපනය, කලාව,

4 පිටුවට




## ඉතිහාසයේ දිනක මෙසේ සිදුවිය...

Ray Chalifoux යනු ගල් අඟුරු ආකරයක රියදුරෙකි. ඔහු වාසය කරන ලද්දේ ඉතා කුඩා කම්කරු නිවසකය. තමාගේ රැකියාව අහිමි වීමෙන් පසුව ඔහුට තම නිවසේ කුලිය ගෙවාගත නොහැකිව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය. දැඩි ධනවාදී රාමුවකින් නිර්මාණය වී ඇති සමාජ ආර්ථික වටපිටාවක, පුරවැසියෙකු විරැකියාවට හෝ රෝගියෙකු බවට පත්වීමෙන් කිසිඳු හව්හරණක් නැති අයෙකු බවට පත්වන රටක් ලෙස ඇමෙරිකාව හැඳින්විය හැක. Ray Chalifoux හට දරුවන් හතර දෙනෙකු සිටි අතර, ඔහුගේ බිරිඳ තවත් දරුවෙකුට උපත දීමට සූදානමින් සිටියාය. මෙහි දිස්වෙන එම අනුවේදනීය දසුන කැමරා කාචයට නතුවන්නේ 1948 අගෝස්තු මස පස්වන දින චිකාගෝ නගරයේදීය. මෙම ඡායාරූපය පසුව ඉන්දියානා ප්‍රාන්තයේ පුවත්පතක් වූ The Vidette - Messenger of Valparaiso හි පළවිය. මිනිස්කම වියැකී මුදල පමණක් රජයන සමාජයක බිහි වූ Ray Chalifoux හා ඔහුගේ බිරිඳ විසින් අවසානයේ නිගමනය කළේ තම දරුවන් හතර දෙනා විකුණා තම ආර්ථික ප්‍රශ්නවලින් ගැලවීමටය. මේ ධනවාදී සමාජයක කුරිරු බව ඔප්පු කිරීමට ඇති ලක්ෂ සංඛ්‍යාත සාධකවලින් එකක් පමණි.




















































# ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලට SYU නියෝජිතයින් රැසක්




මෙවර රුසියාවේ සෝචි හි දී පැවැත්වූ 19 වන ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලට සමාජවාදී තරුණ සංගමය හා සමාජවාදී ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් 30 ක පමණ පිරිසක් සහභාගී වූහ. ජනතා විමුක්ති පෙරමුණ ලෙස සහභාගී වූ විශාලතම කණ්ඩායම මෙවර සහභාගී වී තිබීම ද විශේෂත්වයකි. සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටුව නියෝජනය කරමින් සහෝදර සහෝදරියන් හය දෙනෙකු හා සාමාජිකයින් 20කට ආසන්න පිරිසක් ඒ සඳහා සහභාගී වූහ. එහි දී විදෙස් තරුණ හා දේශපාලන සංවිධාන විශාල ගණනක් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීය. ජනතා විමුක්ති පෙරමුණ සම්බන්ධයෙන් විශාල පිළිගැනීමක් හා ප්‍රසාදයක් එම සංවිධාන තුළ පැවැති අතර එම සම්බන්ධතා දිගින් දිගටම පවත්වා ගැනීමත් අප රටේ දේශපාලන තත්වයත් මෙන්ම ලෝකයේ වාමාංශික දේශපාලන කටයුතු පිළිබඳවත් වැඩිදුරටත් සාකච්ඡා විය.

එම උළලේදී අපේ රටේ තරුණ තරුණියන් මුහුණදෙන ගැටලු, සයිටම් ගැටලුව, උතුරුමැද පළාතේ පවතින වකුගඩු රෝගය, විරැකියාව, අධ්‍යාපන පුද්ගලීකරණය හා, මාධ්‍ය භාවිතාව සම්බන්ධයෙන් වන වැඩසටහන් මෙන්ම කියුබාව, වෙනිසියුලාව, උතුරු කොරියාව හා පලස්තීනය ආදී රාජ්‍යයන් වෙත සහයෝගය පළ කරන වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් ආදියද පැවැත්වීය. උළෙල පසුගිය ඔක්තෝම්බර් 14 සිට 22 දක්වා පැවැත්විණි.

# අඹගහවැව තරුණ සමිතියෙන් "වන්නි පෙළහර" නමින් සාහිත්‍ය උළෙලක්



සමාජවාදී තරුණ සංගමයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බටහිර ආසන බලමණ්ඩලයට අයත් අඹගහවැව තරුණ සමිතිය මඟින් "වන්නි පෙළහර" නමින් සාහිත්‍ය උළෙලක් සූදානම් කර ඇත. එම උළලේ කාව්‍ය සහ චිත්‍ර වැඩමුළු පසුගිය ඔක්තෝබර් 09 සහ 22 යන දිනයන් හි පැවැත්විය. මෙම සාහිත්‍යය උළෙලේ අවසන් උළෙල ඉදිරියේදී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

# නැගෙන හුස්මට අරුත් එක් කරන සප්ත ස්වරය



සමාජවාදී තරුණ සංගමයේ බදුල්ල දිස්ත්‍රික් හාලිඇල ආසනයේ හැතැක්ම තරුණ සමිතිය මඟින් පසුගිය ඔක්තෝබර් මස 21 වනදා "පෙදෙහි රස හව් සොයා යන සුයාමය" යන මැයෙන් සංගීතමය වැඩසටහනක් හාලිඇල, හැතැක්ම, බෝගහකුඹුරේ දී පැවැත්වීය. සමාජවාදී තරුණ සංගමයේ බදුල්ල දිස්ත්‍රික්කයේ "youth generation" සංගීත කණ්ඩායම විසින් සංගීතය සැපයූ අතර මෙම වැඩසහන සමාජවාදී තරුණ සංගමයේ බදුල්ල දිස්ත්‍රික් සංවිධායක අනිල් මංජුල සහෝදරා විසින් මෙහෙයවීය. මේ සඳහා ප්‍රදේශයේ තරුණ තරුණියන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

# අරගලයේ නොනිම් තරුව එළිදකී




අර්නෙස්ටෝ චේ ගුවේරාව මරා දමා පසුගිය ඔක්තෝබර් 08 වැනිදාට වසර 50ක් සපිරීම නිමිත්තෙන් " අරගලයේ නොනිම් තරුව චේ" නමින් සමාජවාදී තරුණ සංගමයේ නවතම ප්‍රකාශනය එළිදැක්වීය. මෙහි අඩංගු වී ඇත්තේ ෆිදෙල් කස්ත්‍රෝ සහෝදරයා විසින් 1967 ඔක්තෝබර් 18 වන දා හවානාවල විප්ලවීය චතුරස්‍රයේ පැවති චේ ගේ අනුස්මරණ දේශනයේ දී කළ කතාවේ පරිවර්තනයකි. සමාජවාදී තරුණ සංගමය විසින් පසුගිය ඔක්තෝබර් 08 වනදා හම්බන්තොට දෙබරවැව ක්‍රීඩාංගණයේදී පැවැත්වූ චේ දිනය දී මෙම පොත එළිදැක්වීය.

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 52/3, අතුරුගිරිය පාර, හෝමාගම පිහිටි ක්‍රියේටිව් ස්ටැම්ප් ඇන්ඩ් ප්‍රින්ටින් ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.